වසර 2500 පසු
මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

# සත්‍ය ධර්මය ඇවදී විය

(පළමු වෙළුම)

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.


## සත්‍ය ධර්මය අවදි විය


බුද්ධොත්පාදෝ ධර්ම දේශනා ශ්‍රවණයට
https://youtube.com/channel/ucwms400m8EsZc9foKtEajg

අන්තර්ජාල ශ්‍රවණයට - website
buddhothpado.com

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 ඔක්තෝබර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්
Email: thanujafernando1975@gmail.com
Tel 077 2246430

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 810, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2884701

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ,
මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක
අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ
දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ.
ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා
යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන
ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට
ඔබට ද හැකියාව ලැබේ.බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ
ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක්
වන තැන සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ.
මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ.
ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම්
ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව
බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චෙතෝවිමුක්තියයි. එනම්

අනිමිත්ත, ශුන්‍යත, අප්පුනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශුන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජීවෝ ශුන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන.
ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි.
ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

## පුණ්‍යානුමෝදනාව

මේ සත්කාර්යය සඳහා නන් අයුරින් උපකාර කළා
වූ සියළුම දෙනාට ද උතුම් වූ ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ කුසලය නිදුක් නිරෝගී සුවපත් භාවය
පිණිසත් මේ ජීවිතය තුළ දී ම චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධය පිණිසත් මෙම ධර්ම දානමය කුසලය
හේතු වේවා.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

# පිදුම



සම්බුදු සසුන මේ ලක්
පොළොවෙහි පවතින තාක් මේ
දහම් අමා ගඟ ලෝ සතුන්ගේ
සිත් සනහමින් නොසිඳී ගලා
යේවා.
මේ ගෝර කටුක භයානක
සංසාරයේ බිය දැක, මේ
ආත්මභාවයේ දී ම සසර දුකින්
එතෙර වීමට අධිෂ්ඨාන කරමින්
වීර්ය වඩමින් නිවන් මඟ ගමන්
කරන්නට සියලු ලෝක සත්වයාට
මේ ධර්මය උපකාර වේවා. තම
තමන්ට වැටහෙන ප්‍රමාණයට
ජීවිතවලට ගලපා ගනිමින්, මෙහි
සඳහන් ධර්ම කාරණා තුළින්
නිවන් මාර්ගයට ම යොමු වේවා.
දහම් ඇස පහළ කරගැනීමට
උපකාර වේවා.

- තනූජා දුශාන්ති

# පටුන


| | |
|---|---|
| | පිටු අංක |
| මට මම නැතිවන හැටි<br>1 වැනි දේශනය | 11 |
| මට මම නැතිවන හැටි<br>2 වැනි දේශනය | 24 |
| මට මම නැති වන හැටි<br>3 වැනි දේශනය | 33 |
| මට මම නැති වන හැටි<br>4 වැනි දේශනය | 52 |

# 1

## මට මම නැතිවන හැටි

**උපාසිකාව:** ගම්පොලින් කතා කරන්නේ ආර්යන් වහන්ස. මේ වෙලාවේ ඔබ වහන්සේට කතා කරන්න පුළුවන් ද?

**ආර්යන් වහන්ස:** අහ්. හොඳයි කියන්න. කියන්න මොකක්ද ගැටලුව?

**උපාසිකාව :** ආර්යන් වහන්ස දැන් අපි මේ අවුරුදු 10ක විතර කාලයක් තිස්සේ සිල් සමාදන් වෙනවා ආර්යන් වහන්ස, ඒ වගේම ධර්ම ශ්‍රවණයත් කරනවා. දැන් මට ආර්යන් වහන්ස මාස 3ක් අතර කාලයේදී ඔබවහන්සේගේ ධර්ම දේශන අහන්න ලැබුණා මේ youtube නාලිකාව තුළින්. මෙත්මල් අරණ බුද්ධෝත්පාදෝ නාලිකාව තුළින්. ඉතිං මේ වෙලාවේ අපිට නොදන්න දේවල් ගොඩාක් දැන ගන්න ලැබුණා. ඒ වුණත් ආර්යන් වහන්ස ඔබ වහන්සේගේ ධර්ම දේශනා 40ක්, 50ක් විතර අහලා තියෙනවා. ඒත් පොඩි ගැටලු කිහිපයකුත් තියෙනවා. පෙර අපි නොදුටු දහමක් අවබෝධ වෙලයි කියලා හිතෙනවා. ඒත් සමහර තැන් වලදි ගැටලු කිහිපයකුත් තිබිලා තියෙනවා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** අහන්න ඒ ගැටලු.

**උපාසිකාව:** දැනට 40, 50ක් විතර ශ්‍රවණය කරලා තියෙනවා. ඒත් ආර්යන් වහන්ස **අපිට ගැටලුවක් වෙලා තියෙන්නේ මොහොතක අවධිය** කියන එක කොහොමද හඳුනා ගන්නෙ කියන එක. **අජ්ජද්ධ බහිජ්ජා** වශයෙන් දකින ආකාරය. ඒ තුළින් අපිට **මගඵල දකින ආකාරය** තමයි දැනුවත් වෙන්න ඕනේ ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** දේශනා 50හි කිච්චවනේ අහලා තියෙන්නේ.

**උපාසිකාව:** ඔව්. දේශන 40, 50ක් විතර අහලා තියෙනවා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** මදි අහලා තියෙනවා. මදි තව. දැන් වයස කීයද?

**උපාසිකාව:** දැන් 63ක් වෙනවා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** අහපු ප්‍රශ්න 2 තමයි **මොහොතට අවධිය, (අජ්කඩද්ධ භගිජ්ජා)** එකම ප්‍රශ්නය තමයි ආකාර 2 ක් විදිහට පෙනුණට. ඒ කියන්නේ දැන් ඔය **මොහොතට** කියන එක **අවධිය** කියන එක. මේ **සිතුවිලි කියන්නේ නාම, රූප, ඒ සිතුවිලි** වලින් වැහිලි තියෙන්නේ. ඒ කියන්නේ දැන් අපි පරිහරණය කරන්නේ සිතුවිලි නේ. දැන් අපි දෙයක් කියලා ගන්න කොට ඒක අපේ අරමුණනේ. එතකොට අපේ අරමුණ නේ සිත කියන්නේ. සිතට එන අරමුණ තමයි හිත කියන්නේ. හැම මොහොතේම අරමුණක් ඇති වෙනවා, නැතිවෙනවා නේ.

**ආර්යන් වහන්ස:** පොත දකින සිත නෙමෙයි බිත්තිය දකින්නේ. බිත්තිය දකින සිත නෙමෙයි, මල දකින්නේ. මල දකින හිත නෙමෙයි පොළොව දකින්නේ. ඔළුව වටයක් කරකවන කොට අපිට එක සිතක් ඉපිද නිරුද්ධ වෙලයි තව සිතක් ඇතිවෙන්නේ. ඒ සිතත් නිරුද්ධ වෙලා තව සිතක් ඇතිවෙනවා. හැබැයි මෙතනදි අපි දැන් එක සිතක් හරියට දැක්කොත් අපිට ඔය හැම සිතම දැක්ක වෙනවා. අපිට එක අරමුණක් හරියට දකින්න බැරුවයි ඉන්නේ. ඒ කියන්නේ **(ක්ෂණසම්පත්තිය)** මේ මොහොතේ සිතක් හට ගන්නවා. හැම මොහොතේම සිතක් හට ගන්නවා. අතීතය ගැන හිතුවත් වර්තමානය මේ මොහොතේයි හිතන්නේ. අනාගතය ගැන හිතුවත් මේ මොහොතෙයි හිතන්නේ. එතකොට මේ මොහොතේ එක සිතක් තියෙන්නේ එච්චරයි.

**ආර්යන් වහන්ස: අතීතං නාත්ත ගම්මේය. අතීතය ගිහිං ඉවරයි. නපටික්ංනි අනාගතං, අනාගතය තාම ඇවිල්ලා නෑ.** හැබැයි මේ මොහොතේ අපිට අතීත සිතක් ආවම ඒක මේ මොහොතේ වර්තමාන සිතක්. එහෙම නේද? දැන් නේ මතක් වෙන්නේ. මේ වර්තමාන සිත ඇර වෙන මුකුත් නෑ. එහෙම නේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** මේ මොහොතේ මේ වර්තමාන සිත ඇර වෙන මුකුත් නෑ. එහෙම නේ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** එතකොට මේ වර්තමාන මොහොතේ ඇතිවෙන සිත තමයි අපි දකින්න උත්සාහ කරන්නේ. ඒකත් ඒ වුණාට ඇත්තක් නෙමේ කියලා එතකොට වැටහෙනවා. ඒ කියන්නේ අපි උපමාවක් ගමු. දැන් මේ මොහොතේ බිත්තිය දකිනවා. එතකොට බිත්තිය දකින හිත කියන්නේ. අර අපි කියන්නේ පොත දකින හිත කියලා නිතරම කියන්නේ, ඒ එන අරමුණ එච්චරයි.

**ආර්යන් වහන්සඃ චක්ඛු විඤ්ඤාණ සිතක්, පොත දකින සිත** එතකොට ඒ සිත අපි බැලුවොත් එහෙම දැන් පොත කියන්නේ ඇත්තටම පොත කියලා දෙයක් බාහිර තියෙනවද? අපි හිතින් අර පොඩි කාලේ අපි හදා ගත්ත දේ නේද පොත කියන්නේ. අපි මොන්ටිසෝරි යන කාලේ කිව්ව අර රතුපාට, නිල්පාට, කහපාට. ඒ වගේ රූපෙට දාපු ශබ්දයක් තමයි පොත කියන හැඩතලය එනකොට පොත කියලා දැම්මා. අපි ඇමරිකාවේ හිටිය නම් Book කියලා දානවා නේ. දැන් මේවා දේශනා වලින් ඇහුව්වා නේද?

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** එතකොට අපි ඒ හදා ගත්ත එක සිතුවිල්ලක්. එතකොට මේ මොහොතේ එන අරමුණම කියන්නේ සිතුවිල්ලක්. අපි හිතින් හදා ගත්ත එකක් නේ. බාහිර කියන එකක් නෙමෙයි. එහෙම නේද?

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** එතකොට අපි හිතින් හදා ගත්ත එකක් අපි හිතින් බාහිර තියෙනවා කියලා හිතන් ඉන්නවා. හිතන එක තමයි අපි රැවටීම. **අර විඤ්ඤාණය බාහිර.** අර පොත කියන **විඤ්ඤාණය** අර **ස්කන්ධය** නිසා හටගත් එක **ඒක බාහිරෙයි කියලා අපි හිතන එක.** අන්න බාහිරෙයි කියලා හිතන් ඉන්න එක ඒක රූප සංඥාවක් සිතුවිල්ලක්. මේ **රූප සංඥාවක්, චිත්තයක්** තමයි **මේ පොත කියන්නේ.** අපි එන හැඩතලය අපි අර කියන්නේ පොත තමයි කියලා නේ. **ඒක චිත්තයක්. නාම රූප**

කියන්නේ **චත්තාරෝච මහා භූතානං, චතුංනඤ්ච මහා භූතානං උපදාය රූපං රූපං** කිව්වේ **මහාභූතං ඇසුරු කරගෙන හැදුණ එක ආයිත් මහාභූත නෙමේ**. ඒක මේ '**රුප්පණය**' නිසා මෙතන '**ස්පාක්**' එක නිසා හටගත්ත අර **රුප්පණයෙන්** හට ගත්ත **රූපයක්. රූපං රූපත්තාය අභිසංකරණ**

**ආර්යන් වහන්සෘ** දෙයක් කර ගැනීම ඒක බාහිරෙයි කියලා හිතන එක තමයි රැවටීම. අන්න **අජ්ඣඩද්ධ භහිද්ධා භහිද්ධා කිව්වේ අර බාහිරෙයි කියලා හිතපු එක. අජ්ඣඩද්ධ කිව්වේ මෙතන හිතන එක. හිතන දේම බාහිර තියනවා කියලා. අන්ත දෙකක් හදා ගත්ත එක. නමුත් අන්ත 2ක් නෑ.** ඇත්තටම කිව්වොත් පොත කියලා හිතන දේත් ඇත්තක් නෙමේ. ඒකත් ඒ ශබ්ද, වර්ණ එකතු වෙච්ච එකක්. ඒ කියන්නේ ඇසට ආවේ වර්ණයක්. කනට අර පොඩි කාලේ ආවනේ ඒකට අර දාපු ශබ්දේ පොත කියලා. ඒකම තමයි දැන් අපි කියන්නේ **චිත්තයක්** කියලා. **ශබ්ද තරංගයි වර්ණ තරංගයි** එකතු වෙලා **චිත්ත තරංගයක්** හැදෙනවා. මේක තමයි අපිට **ආරෝපණයක්** වෙලා. මේ **මොහොතේ අපිට අර ශබ්දය ආවොත් වර්ණයත් එනවා. ඒකට චිත්තයක් කියනවා** නේද?

**ආර්යන් වහන්සෘ** දැන් මේ පැත්තෙන් අන්නාසි කිව්වොත් ඔය පැත්තෙන් අන්නාසි ගෙඩියක් මතක් වෙනවනේ. රූපයක් එනවනේ. එතකොට ඒක නේද මේ **චිත්තය** කියන්නේ. දැන් අපි සුද්දෙකුට අන්නාසි කිව්වහම තේරෙන්නේ නැහැනේ. රූප එන්නේ නැහැ නේ. අර පොඩි කාලේ දුන්නු රූපය නේ දැනුත් එන්නේ. ඒක තමයි අපේ වේගය තුළ අර එතන එතන **ට්‍රිලියන් ගාණක් ශබ්ද, වර්ණ** එකතු වෙලා ස්පාක් වෙවී තියනවා. අපිට පේන්නේ හැම තිස්සේ ම **බිත්ති, මේස, ඇඳ**. අපිට **මහා භූත** පෙන්නැ. ඒකයි **සිතුවිලි** විතරයි. ඒවා **ඇසුරු කරන් ගිනිබෝලේ කරකැවෙනවා වගේ. වළල්ලක් වගේ** පේනවා.

අර '**චිත්තාරෝපණය ආත්මීය දැනීම**' මේ ඔක්කොම තියනවා වගේ දැනෙන එක. තියෙන්නේ මොනවද? බාහිර නෙමේ අපි හිතන ඒවා අර අපිට දාපු දත්ත. ඒකයි කැරකැන්නේ. අර අපි කියන්නේ මේ ලෝකේ ජනගහනය කෝටි 800ක් ඉන්නවා නම් කෝටි 800 ම මේ සිත තුළ ටොල්කෙක ඉන්නවා කියලා. එළියේ නෙමේ කියලා නේද? අපි කියනවා නේ එලියේ මොනවහරි දෙයක් පෙන්නුවත් අපි කියනවනේ තව කෙනෙක්

දැක්කත් දෙන්නම හිත ඇතුළේ තියෙන දේයි දකින්නේ නේ. එළියේ තියෙන දෙයක් නෙමේ නේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** එතකොට මෙන්න **මේ අපි චිත්තේන නියති ලෝකේ තමයි අපි හීනෙන්නුත් දකින්නේ.** ඒ **සිතුවිලි විතරයිමයි.** අර මේක **ස්පාක්** වුණේ **ශබ්ද, වර්ණ.** ඒවා එකතු වෙලා දෙයක් කියලා පොත, මේසේ කියලා ගත්ත එක **මනෝ විඤ්ඤාණය.** ඒක ම නැවත නැවත වෙනවා ආයි අලුත් වෙවී අලුත් වෙවී. **මනෝ විඤ්ඤාණයෙන්** දැන් ස්පාක් වෙනවා නේ කියලනේ කියන්නේ. ඒ **සිතුවිලි නැවත නැවත අලුත් වෙවී ස්පාක් වෙවී තියනවා. ඒකට කියනවා 'මනා ආයතන' කියලා.** ඒකනේ අපට හීන පේන්නේ. සිතුවිලිත් නැවත නැවත අලුත් වෙවී තියනවා නේද?

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යන් වහන්ස:** එතකොට මේ ආයතන 6 නිසා අප දැන් මේ ආත්මයක් විදිහට ජීවත් වෙනවා වගේ දැනෙනවා. ඇයි දැන් මේ ඔක්කෝම තියනවා වගෙනේ හිතන්නේ. ඒක තමයි අපේ **ආත්මීය ආරෝපණය.** මේ දැන් මම ඉන්නවා මේ මට දැනෙන්නේ. මේ මේසෙ තියෙන්නේ ඇඳ තියෙන්නේ. පොත තියනවා නේද? ඒක තමයි **ආත්මීය දැනීම අපේ රැවටීම.** එහෙම

අපි හිතන ඒවා කොහේවත් නෑ. අපි හිතන ලෝකෙක ජීවත් වෙනවා. ඒකයි සිතුවිලි ලෝකෙක ඉන්නවා කියන්නේ. අපි ටීවී එක දිහා බලාගෙන අර හිතේ තියෙන සිතුවිලි ලෝකෙ අවුස්සගෙන රාග, ද්වේෂ, මෝහ අර ඇලෙන ගැටෙන අර චූන් වෙවී ඉන්නවා. ටීවී එකේ ප්ලාස්ටික් බෝඩ් එකේ මුකුත් නෑනේ. අපේ සිතේ තමයි ඇවිස්සෙන්නේ. ඔක්කෝම **රාග, ද්වේෂ, මෝහ** අපි හිතෙත් එහෙමයි. සිතුවිලි අවුස්සගෙන ඉන්නේ. හැම තිස්සේම ස්පාක් වෙනවා. **ආශ්වාස ප්‍රාශ්වාසන වෙනකම්ම ඒක වෙනවා.** දැන් හොඳට තේරෙනවා එතකොට අපි මේ බාහිර කියලා අන්තයක් කියලා හිතන් ඉන්න දෙයක් මිසක් **'අජ්ඣද්ධ හගිද්ධා'** කියලා අන්ත 2 හදාගෙනයි. ඒ කියන්නේ මේ **සේරම සිතුවිලි අන්ත දෙකක් නෑ.** ඇත්තම කිව්වොත් එක අන්තයයි. එක අන්තෙත් නෑ ඇත්තටම බැලුවහම. දැන් පොත කියලා දෙයක් නෑ. **ශබ්ද, වර්ණ** තියෙන්නේ.

**ආර්යන් වහන්සඃ ශබ්ද, වර්ණ** ඈර වෙන මුකුත් **මේ ආයතන වලට එන්නේ නෑනේ. ඇසට-වර්ණ, කනට-ශබ්දයක්, නාසයට-ගන්ධයක්, දිවට - රසක්, කයට-උණුසුම සීතල, ඔය ටික එකතු වෙන එක විතරයි වෙන්නේ.**

**ආර්යන් වහන්සඃ** ඕකට කිනවා **පටිච්චසමුප්පන්න** වෙනවා කියලා. ඕකෙන් තමයි අපි දෙයක් කියලා ගන්නේ. මේක දීර්ඝව පැහැදිලි කරලා තියෙනවා දේශනා වල. නමුත් දැන් මෙතන, ඔන්න **දැන් ප්‍රශ්නයට උත්තරය දෙන්න යන්නේ.**

**ආර්යන් වහන්සඃ ඒ කියන්නේ අපි දැන් මේ හිතන එක බාහිරෙයි කියලා ගත්තට එහෙම දෙයක් නෑ නේ. හිතෙත් එහෙම දෙයක් නෑනේ. 'අන්න සිතුවිල්ල' පොත දකින සිත බාහිරෙන් හම්බවෙන්නේ නෑ. සිතෙන් එහෙම හම්බ වෙන්නේ නෑ. එතකොට සිතුවිල්ලට හරයක් නැති වෙනවා. පිහිටන්නේ නෑ කොහේවත් තියනවා කියලා. රැවටෙන්නේ නෑ. 'අන්න විඤ්ඤානං අනිදස්සනං, අනන්තං සබ්බතෝ පදං. විඤ්ඤාණය අනිදස්සනං වෙනවා. එතකොට නාම රූප උපරුජ්ජණය වෙනවා. නාම රූප දෙකම මිදෙනවා. ඇයි මිදෙන්නේ?**

**දෙකේම එහෙම හිතෙන දේ කොහේවත් නෑ. ඔව් බාහිර පොතේ කියලා දෙයක් හිතකත් නෑනේ. බාහිරත් එහෙම දෙයක් නෑනේ. එතකොට අපි හිතපු දේ කොහේවත් අපිට හම්බ වෙන්නේ නෑ. එතකොට අන්න අනිදස්සනං වෙනවා. නිමිත්තක් නෑ.** පොත කියන නිමිත්තෙන් මිදෙනවා. **අනිමිත්තයි, ශූන්‍යතයි.** දැන් ඒක හම්බ වෙන්නේ නෑ. ඒ කියන්නේ සාමාන්‍යයෙන් අපි වෙනදා විදිහටම දකිනවා. දකින්නෑ නෙමේ. අන්ධ වෙලා නෑ. බිහිරි වෙලා නෑ. නමුත් අපිට **අවබෝධයක්** ඇතිවෙනවා මේ හිතන ඒවා කොහේවත් නෑ කියලා.

**ආර්යන් වහන්සඃ** අන්න ඒ කණ්ණාඩියේ මුකුත් නෑ කියල අපිට අවබෝධයක් තියෙනවා නේ. හැබැයි කණ්ණාඩියේ ඔක්කොම පේනවානේ. ඒ වුණාට අපි දන්නවනේ ඇතුලේ මුකුත් නෑ කියලා. ඒ වගේ ලෝකේ ඔක්කෝම අපිට පෙනුණත් අපි දන්නවා එහෙම දෙයක් නැති බව. **'අවබෝධක්ඥානයක්' සංඛිතේ නිබ්බිදාය කණ්ණාඩියේ මුකුත් නෑ කියලා අවබෝධයක් තියෙන්නේ.** එතකොට අපිට ලෝකෙත් මුකුත් නෑ කියලා අවබෝධයක් තියෙන්නේ. **අන්න එතනයි විඤ්ඤාණය අනිදස්සන වෙන**

**තැන. නාම රූප දෙකෙන් මිදුණ තැන 'පජ්ජේ පරිඤ්ඤාණ' අන්න ඊට පස්සේ තමයි මේ මොහොතට අවධිය.**

**ආර්යන් වහන්සෑ:** කියන එක තියෙන්නේ. මොහොතට අවධිය කියන එක කාලයට අදාළ එකක් නෙමේ. මේකට සිතුවිලි නෑ. දැන් ඔබතුමිය බිත්තිය දකිනවා. අපි මීට කලින් දේශනයකත් මේක පැහැදිලි කරා. බිත්තිය දැකපු මොහොතේ බිත්තිය දැකපු බවට සිහියක් අපි ගාව තියනවා. ඒක පුංචි දරුවට තියනවා කියලා අපි කිව්වා. **ප්‍රභාස්වර සිත** කියලා. ඇයි පුංචි දරුවා බිත්තිය මුකුත් දන්නේ නෑ. ඒත් පේනවා එතකොට සිහියක් තමා තියෙන්නේ. එතන **සිතිවිලි, සංඛාරා** නෑ. බිත්තිද, මේසද, ඇඳ ද කියලා නෑ. පුංචි දරුවට එහෙම දාන්න බෑ. මොන්ටිසෝරි යනකොටත් කියලා දෙනවා. ඒ කියන්නේ දන්නෑ කියලා.

ඒ කියන්නේ **සංඛාරා පනවන්න බෑ. ස්කන්ධානං පාතිභාවෝ, ආයතනං පටිලාභෝ, අයං උච්චේ ජාති කියලා. බුදුන් වහන්සේ "ජාති ධම්ම සූත්‍රයේ" පෙන්නනවා. මහණෙනි ඇසේ උපතයි උපත. ඇසෙන් දෙයක් දැකලා ඒක මේසයක් ඇඳක් කියලා හටගත්තොත් අන්න උපත. අන්න එතනයි ජාතිය හට ගන්නේ. එතැනයි දුක හටගන්නේ. එතනයි කෙලෙස් හට ගන්නේ. එතනයි සංඛාරා හටගන්නේ. "අවිද්‍යා පච්චයා සංඛාරා"** අන්න එදා ඉඳන් අපි ඊර්සියා කරනවා. වෛර කරනවා. ඇලෙනවා. ගැටෙනවා. ඇයි දෙයක් තියනවා.

හැබැයි ඒක බාහිර නෙමේ. ඒත් සිතුවිල්ලක්. ඒකයි **සංඛාරයක්** කිව්වේ. **සංඛාරයක් බාහිර** කොහේවත් හම්බ වෙන්නේ නෑ. ඒක **ශබ්ද, වර්ණ ශබ්ද, වර්ණමයි** එකතු වෙන්නේ. **ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස, සියල්ලම** තියනවා. ඒ එකතු වෙන එක තමයි නැවත **ස්පාක් වෙනව** කියන්නේ. **"වට්ටං වට්ටති" ශබ්ද වර්ණ** විදිහට **වෙනම වට්ටයක් කැරකෙනවා**. ඊට අමතරව **මනෝවිඤ්ඤාණය** කියලා එකක් එන්නේ මේ ටික එකට එකතුවීමෙන්. ඒකයි **මනෝවිඤ්ඤාණය, මනෝවිඤ්ඤාණය** කියලා ඇඟ ඇතුළේ කොහේවත් නෑ. මේ **වර්ණය** කියන එකත් ඇඟ ඇතුළේ සිතක් නෙමේ. දන්නවනේ ඒක කිව්වනේ. ආලෝකය තියෙන නිසයි පේන්නේ. එහෙනම් ඒක ස්පාක් වෙනවා. සිත කියන එක ඇතුළේ කතාවක් නෙමේ. සිත කියන එක කොහේවත් නෑ නේද?

එතකොට අපිට පැහැදිලියි මොහොතට අවධිය කියන එක දැන් හැම මොහොතේම සිතුවිලි වලින් මිදුණොත් තමයි හම්බ වෙන්නේ.

**උපාසිකාව:** මොහොතට අවධිය

**ආර්යන් වහන්ස:** ඔව් මොහොත කියන එකට **නාම, රූප නෑ**. අපි හිතන සිතුවිලි කියන තැන මොහොත නෑ. අවධිය නෑ.

**උපාසිකාව:** එතන ගැටීමක් පමණයි නේ ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** එතන තියෙන්නේ **සිහිය**. එතන නාම, රූප නෑ. සිතක් හටගෙන නැතිවුණ බවට අපිට සිහියක් තියනවා. ඒක තවත් සිතුවිල්ලක් නෙමේ. **සිතුවිලි වල නාම, රූප** තියෙනවා. **සිතුවිලි කියන්නේ 'විඤ්ඤාණ මායාව' විඤ්ඤාණ මායාව හැදෙන්නේ නාම, රූප එකතු වෙලා.** තේරුණා නේද? **නාම රූප පච්චයා විඤ්ඤාණං** එතකොට ශබ්ද, වර්ණ එකතු වෙන එක තමයි නාම, රූප කියන්නේ. දැන් පොත කියනනේ මේ පැත්තෙන් අන්නාසි කිව්වොත් ඔය පැත්තෙන් රූපයක් මැවෙනවා කිව්වේ, **ශබ්ද, වර්ණ එකතු වෙලා ඒක තමයි විඤ්ඤාණ මායාවේ සිතුවිල්ල. ශබ්ද, වර්ණ එකතු කරගත්තේ ඔබතුමියගේ ඇතුළාන්තයේ තියෙන විඤ්ඤාණයේ ඒක හසුවෙනවා.**

**ශබ්ද** ආවත් වර්ණයක් එනවා. ඒ කියන්නේ **චිත්තයක්. වර්ණයක්.** එතකොට **ශබ්දයක්** එනවා කියන්නේ **චිත්තයක්**. එළියේ තියන එකක් නෙමේ. **සිතුවිල්ලක්**. අපි හිත ඇතුලේ ලෝකෙක ජීවත් වෙන්නේ. අපි එළියේ තියෙන ලෝකෙක නෙමෙයි නේද?

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස: "නතේ කාමායන චිත්‍රායන ලොකෝ, සංකප්ප රාගෝ පුරිසස්ස කාමෝ"** මේ ලස්සන කැත තියෙන්නේ බාහිර චිත්තයේ නෙමේ. ලස්සන කැත තියෙන්නේ අපේ හිතේ. අපියි හිතන්නේ මේක ලස්සනයි, කැතයි කියලා. පොත කියන්නැ පොත කියලා. අඹ ගහ කියන්නෑ අඹ ගහ කියලා, නුග ගහ කිව්වේ නෑ, අපියි කියන්නේ. මේ හැම එකම. අර දාගත්ත ශබ්ද ටික. **සම්මුති ප්‍රාග්නප්ති** කියලත් කියන්නේ ඕකට තමයි.

**ආර්යන් වහන්ස:** එතකොට මොහොතට අවධිය කියන එක දැන් පැහැදිලියි. දැන් ප්‍රායෝගික වෙන්න ඕන. දැන් හැමතැනම කෙනෙක්

හම්බ වෙන්න බෑ. දෙයක් හම්බ වෙන්න බෑ. දෙයක් තිබ්බොත් කෙනෙක් ඉන්නවා.

**උපාසිකාව:** දෙයක් තිබ්බොත් කෙනෙක් ඉන්නවා. එහෙමයි.

**ආර්යන් වහන්සෑ:** පොත තිබ්බොත් මමමයි පොත. ඇයි **මනෝවිඤ්ඤාණය නේ** මම කියලා වෙනම දෙයක් නෑ. පොතමයි මම කියන්නේ. ඒක අපි මේ දේශනා වල සාකච්ඡා වල මේ ටිකේ **"ජානතෝ පස්සතෝ"** කියලා ඔතන්ට තමයි ආවේ. අර අපි **"ජානතෝ පස්සතෝ"** කිව්වේ **"සිතුවිලි වලට එහා ගිය සිහියක්"** ජේනවා නෙමේ හිතනවා. අපිට දැනෙන දේ වෙනයි හිතන දේ වෙනයි. දැනෙන දේ තමයි අර අපිට හැම තිස්සේම අර **"ඤාණය"** කියලා අපි පෙන්නුවේ. **"ඒක මොහොත" ඒක ප්‍රභාස්වරයි.** ඒක අපි පෙන්නුවා. එතන තමයි හැම තිස්සේම **අපේ ගෙදර, සතිය තමයි අපේ ගෙදර ඒක සම්මා සතිය.** ඒකේ නෑ නාම, රූප. ඒ මොහොත කියන්නේ ඒ මොහොතට කාලයක් නෑ. නාම, රූප නෑ කියන්නේ අන්තයක් නෑ. දෙයක් කියලා ගන්න බෑ. අවධිය කියන එක දෙයක් නෙමේ.

දැන් පොත කියන්නේ දෙයක් නේ. මේසේ කියන්නේ දෙයක්. එතකොට **සංඛාර** කියන්නේ **ආත්මීය දැනීමක්** දෙයක් කියන්නේ. එතකොට මේ සත්‍යය දකින කොට අපේ සිතුවිල්ලටයි දෙයක් තියෙන්නේ **විඤ්ඤාණ මායාව. ශබ්ද, වර්ණ** එකතු වුණු නිසයි දෙයක් තියෙන්නේ. එතකොට දැනෙනව නම් මොනවහරි ඒක **විඤ්ඤාණයක්** නේ. ඒක දෙයක්. දැන් නාමයයි, රූපයක් එකතු වෙච්ච එකක් නම් සිතුවිල්ලක්. එතකොට ඒවා සේරම බොරුවක්. ඒවා කොහේවත් නෑ. අපි හිතන ඒවා කොහේවත් නෑ. දැන් මෙතන ඇමරිකන් ජාතිකයෙක්ගේ භාෂාව වෙනස්. චීන ජාතිකයෙක් හිටියොත් භාෂාව වෙනස්. එතකොට ඒ භාෂාවෙන් කියන වචන කොහේවත් නෑ. ඒක ඇත්තක් නෙමේ.

නමුත් අර සිහියට හසුවෙනවනේ. අර පුංචි ළමයගේ **ප්‍රභාස්වර සිත** වගේ. ඒක තමයි **පරම සත්‍යය**. ඒකට **නාම, රූප** නෑ. ඒක දැනීම දැනීමක් විතරයි. ඒ කියන්නේ ඒක සිහියක් විතරයි තියෙන්නේ. ඒක අති සියුම් නේද එතකොට. දැන් මෙතන ඊටත් වඩා සියුම්.

**ආර්යන් වහන්සෑ:** ඔබතුමිය ඇහුවනේ **"අජ්ඣද්ධ භහිද්ධා"** කියලා. දැන් බලන්න අපි කියනවා **සෝතාපන්න වෙනවා කියන්නේ බාහිර හිතන**

**දේ නැති බව දකින එක තමයි. බාහිරෙන් මිදෙනවා.** ලෝකය බාහිර කියන ලෝකය නම් සිතුවිල්ලක් කියලා දකිනවා. එතකොට ඒක **සෝතාපන්න භූමිය** කියලා පෙන්නුවනේ. **"පටිසෝතය"** එළියේ තියන ලෝකය ඇත්ත කරගන්න එක **පෘථග්ජන භූමිය**. එළියේ දේ සත්‍යයක් නෙමේ කියලා දකින තැන සිතුවිල්ලක් කියන දකින තැන **සෝතාපන්න, පටිසෝතයට** එන එක නේද? එතනින් තමා එන්නේ මාර්ගය. එතකොට බලන්න ඊළඟ එක **අනාගාමී භූමිය ප්‍රතිපදාවේදී** මොකද කිව්වේ.

**ආර්යන් වහන්සඃ** අපි කිව්වා පොතෙන් තොර මමෙක් නෑ කියලා. අර හිස් බැල්මකින් ලෝකය දකිනවා වගේ. ඒ කියන්නේ නාමය තුළ දෙයක් නෑ. දැන් **ශබ්ද, වර්ණ** එකතු වෙච්ච එකක් නේ. එතකොට මේ මොහොතේ එන අරමුණනේ මේ ඔක්කෝම කතා කරන්නේ. අරමුණනේ පොත කියන්නේ. එතකොට මේ පොත කියන අරමුණ ඇත්ත වුණොත් මම ඉන්නවා. පොත දකින මම ඉන්නවා. **ඒතං මම ඒක දකින මම. පොත කියලා දෙයක් නැති බව දකිනවා කියන්නෙත් ඒ කියන්නේ මමත් නෑ. ඔන්න ඔතනයි ගැඹුරුම තැන. තමන්ට මේසේ, පොත, ඇඳ සේරම තියන බවට අපි හිතනව නම් ඒ තමයි ආත්මේ.** මේ ආත්මේ කියන්නේ මැරෙන්නේ හිත නේ. කය නෙමෙයිනේ. හිත හැම මොහොතේම ඇතිවෙලා නැතිවෙනවෙ නේ. හුස්ම නවතිනකම් හිත ස්පාක් වේවි ඇතිවෙනවා නැතිවෙනවා නේ. එතකොට හුස්ම නැවතුණොත් අන්න හිත නෑ. අන්න මැරිලයි කියනවා. ඊට පස්සේ කය වළලලා දානවා නේද?

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** දැන් මේ මොහොතෙත් බලන්න මේ කයෙහි මම කියලා හිතන එකක් නේද තියෙන්නේ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** දැන් මගේ ඇඟිල්ලක් කපනවා. එතකොට දැන් මගේ ඇඟිල්ලක් ද කපලා තියෙන්නේ. නෑනේ. මේ කැපුවා කියලා හිතන එකක් නේ තියෙන්නේ. දැන් කකුල කපනවා. කකුල කැපුවා කියලා හිතන එකනේ තියෙන්නේ. ඊට පස්සේ කකුල් දෙක කපනවා. කකුල් දෙක කැපුවා කියලා හිතන එක නේ තියෙන්නේ. ඊට පස්සේ අත් දෙක කපනවා. අත්දෙක කැපුවා නිසා හිතන එකනේ තියෙන්නේ. අත් 2, කකුල්

2 නැතුව එක එක අනතුරු වලට මුහුණ දීපු අයව *Youtube* එකේ දාලා තියෙනවා නේද? එහෙම ඉන්නවා නේද අය. අත් 2 නෑ. කකුල් 2 නෑ. හැබැයි අත් 2 නෑ කකුල් 2 නෑ කියලා හිතන එක නේද තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** මේ කය මමයි කියලා හිතන එක නේද තියෙන්නේ.

**උපාසිකාව:** කය මම නෙමෙයි. පැහැදිලියි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** එතකොට මම කියන්නේ සිතුවිල්ලක්. සිතුවිල්ලක කොහෙන්ද ආත්මයක්.

**උපාසිකාව:** සිතුවිල්ලක ආත්මයක් නැහැ.

**ආර්යන් වහන්ස:** එතකොට මේ දරුවා කියලා හිතන එක නේද තියෙන්නේ. දරුවා ඉන්නේ හිතේද? මේ මහත්මයා කියලා හිතනවා නේ. මේ ගෙදර කියලා හිතනවා නේ. එතකොට මේ ඔක්කෝම සිතුවිල්ලක් නේ. සිතුවිල්ලට කොහේද දරුවෝ. සිතුවිල්ලට කොහේද මහත්තයෙක්. සිතුවිල්ලට කොහේද ගෙයක්. මේ ඔක්කෝම සිතුවිල්ලක් නේ.

**උපාසිකාව:** පැහැදිලියි.

**ආර්යන් වහන්ස:** දැන් පොත කියන්නෙත් සිතුවිල්ලක්. මේ රූපේ කියන්නේ සිතුවිල්ලක්. මමයි කියන්නේ සිතුවිල්ලක්. එතකොට පොත කියලා දෙයක් නැත්නම් එතකොට මමත් නෑ. දැන් ඔක්කෝම නැති වෙනකොට මාත් නෑ. දැන් මම කොහේද ඉන්නේ?

**උපාසිකාව:** මම කියලා කෙනෙක් නෑ.

**ආර්යන් වහන්ස: දෘෂ්ටියක්. සක්කාය දෘෂ්ටියක්.** අර කියන්නේ පෘථිවිය විනාශ වෙනවා කියලා සූර්යාගෙන් රස්නයෙන් වැඩිවෙලා අළු වෙලා. අර ගිතෙල් දැවුන තැනක අළුත්, දැලිත් ඉතිරි වෙන්නෑ කිව්වේ. බුදුන් වහන්සේ උපමා කරන්නේ මුකුත් ඉතුරු වෙන්නෑ කියලා. අන්තිමට දෘෂ්ඨියක්, සක්කාය දෘෂ්ඨියක්, අර කියන්නේ පෘථිවිය විනාශ වෙනවා කියලා. සූර්යයාගේ රස්නය වැඩිවෙලා අළුවෙලා. අර ගිතෙල් දැවුනු තැනක අළුත්, දැලිත් ඉතිරි නැතුවම යනවා කියලා බුදුන් වහන්සේ උපමා කරන්නේ. අන්තිමට අභ්‍යවකාශය විතරයි ඉතුරු වෙන්නේ.

එතකොට මේ හිතන ඒවා කෝ. බොරුවක් නේ. ඇත්තටම කොහේවත් නෑනේ. අභ්‍යවකාශය විතරයි. ශූන්‍යයි. **නිස්සත්වෝ නිස්ජීවො ශූනයෝ.** අන්න **අනිමිත්තයි. ශූන්‍යයි. අප්‍රනිතයි**. දැන් හරි දැන් නිවන් දකිනවා.

**ආර්යන් වහන්සः** මෙනෙහි කරන්න නම් තියනවා ගොඩක් නේද?

**උපාසිකාවः** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සः** නිවනටම අරන් ගියා වගේ නේද එකපාරම.

**උපාසිකාවः** ඔව් ආර්යන් වහන්ස ඇත්තටම එහෙමයි.

**ආර්යන් වහන්සः** හිතාගන්න බෑ නේ. බුදුබණ නම් කොහොමද නේ. වැදි බණ නම් කෙසේද? බුදු බණ ඇසුවොත් උඩු යටි මාරු වෙනවා. කල්පයක් හිටියත් වැඩක් නෑ මේ සත්‍යය ඇහෙන්නේ නැතුව. අපි බොරුවට නේ හැම දෙයක් ම සිතුවිල්ලෙන් නේ අල්ලගෙන තියෙන්නේ. එහෙම දෙයකුත් නෑ නේ. ආත්ම 2 කුත් නෑනේ. **"චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ, අනිච්චං භන්තේ."** ඇස කියන්නේ ජේන බවට පොත, මේසේ, ඇඳ.

**ආර්යන් වහන්සः** මහණෙනි ඇස **අනිත්‍ය ද? අනිත්‍යයි** ස්වාමීනි. එහෙමනම් දුකද, සැපද "දුක්ඛං භන්තේ" එහෙනම් මහණෙනි ඇස අනිත්‍ය නම්, දුක නම්, ඇස කියන්නේ මේ පොත, මේසේ, ඇඳ කියන එකමනේ. ජේන බවටනේ ඇස කියන්නේ. මස් ඇහැට නෙමේනේ. එහෙනම් ඒ සිතුවිල්ලනේ. එන අරමුණනේ. ඇස කියන්නේ පොතනේ. එහෙනම් පොත නෑ කියන එකනේ මේ කියන්නේ. හිතන එක කොහේවත් නෑනේ. අන්න ඒකටයි **අනිත්‍යයි** කිව්වේ. හිතන දේ කොහේවත් නෑ. එහෙනම් මහණෙනි, ඇස අනිත්ත නම් එය ආත්ම වශයෙන් ගත හැකිද? **නෝ හේතං භන්තේ. අනාත්ම ධර්මය** හමුවෙනවා. සිතුවිලි වල කොහෙන්ද ආත්මයක්. සිතුවිලිත් අන්තිමට බොරුවක්.

**ආර්යන් වහන්සः** අන්තිමට ශූන්‍යයි. **ශූන්‍යත පටිසංයුක්ත දේශනා කිව්වේ ඒකයි. බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන්නේ පෙර නොඇසූ විරූ දහමක්. යේ ධම්මා හේතුං භගවා. තේසං හේතු තථාගතෝ. ඒ තථාගතයන් වහන්සේ හේතුඵල දහමක් දේශනා** කරයි. **තථාගතවරු කර්ම ඵලය** ගැන කතා කරන්නේ නෑ. ඵලක් නෑ. ඒක හැම ආගමකම තියෙනවා. ඒකට බුදු කෙනෙක් අවශ්‍ය නෑ. **අබෞද්ධධෝත්පාද** කාලයෙත්

පන්සිල් රැක්කා. ආර්ය උපාසක සිල් රකිනවා. මහමායා දේවිය බුදු කෙනෙක් පහළ වෙන්න කලිනුත් රැක්කා. අපිට මේ රාවණා යුගයෙත් හම්බ වෙනවා පන්සිල් රැක්ක හැටි.

**ආර්යන් වහන්සේ:** එතකොට අපිට තේරෙනවා මේ හේතුඵල දහම ඇත කිව්වත් වැරදියි මහණෙනි. නැත කිව්වත් වැරදියි මහණෙනි. තියන ලෝකයක් නැහැ මහණෙනි කිව්වේ නේද?

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ: හේතුං පටික්ක සංභූතා. හේතු භංගා නිරුජ්ජති.** සොබා දහමෙ මැවෙන දේ සොබා දහමටම දියවෙලා යනවා. හරි පුදුම දහමක්. අවබෝධ කරගත්තොත් කොච්චර වටිනවද?

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** මෙච්චර කාලයකට අපි අහපු බණ මොනවද කියලා හිතෙනවා. ඔබතුමිය භාග්‍යවන්තයි එක් දවසක හරි සත්‍ය ධර්මය අහන්න ලැබෙනවා. ඔබතුමියට සසර දුකින් මිදෙන්න හේතු වෙනවා.

**ආර්යන් වහන්සේ:** තෙරුවන් සරණයි.

**උපාසිකාව:** තෙරුවන් සරණයි.

# 2

## මට මම නැතිවන හැටි

**ආර්යන් වහන්සේ:** ඔබතුමියට මේක ටිකක් මෙනෙහි කරන්න ඕන. ඔබතුමිය මෙතනින් පැනලා යන්න හදනවා. එතන මෙනෙහි කරන්නම ඕනම තැන පැනලා යන්න හොඳ නෑ. ඒ කියන්නේ මම කෝ, මම සිත දැන් මේ දැන් මෙතන දැන් එතකොට මේ කය කියලා හිතනවා, මේ දරුවා කියලා හිතනවා. මේ මහත්තයා කියලා හිතනවා. මේ ගෙදර කියලා හිතනවා දැන් මම කෝ, දැන් මම සිත විතරයි. දැන් සිත කෝ.

**උපාසිකාව:** හිතක් නෑනේ. හිතන එකනේ සිත.

**ආර්යන් වහන්සේ:** සිත කියන්නේ මේ ශබ්ද, වර්ණ ස්පාක් වෙන එකට විතරයි.

**උපාසිකාව:** ශබ්ද, වර්ණ ස්පාක් වෙන එක විතරයි. ඔව්.

**ආර්යන් වහන්සේ:** ආත්මයක් කෝ?

**උපාසිකාව:** අහ්. මට තේරුම් නෑ. අහ් ඔව් ඉතිං ආත්මයක් නෑනේ. ආත්මයක් කියලා ඉතිං හිතුවොත් ඉතිං අර දැනෙන ස්වභාවයට නේ ආත්මය කියලා කියන්නේ. දැං අපි ඉන්නවා කියලා කාලයක් තිස්සේ ඉඳලා ඉඳලා.

**ආර්යන් වහන්සේ:** අහ් හරි. හරි. අපි තව ටිකක් ලේසි කරන්නම්, මේ සිතට ආත්මයක් තියෙනවාද?

**උපාසිකාව:** නෑ.

**ආර්යන් වහන්සේ:** ආත්මය කෝ?

**උපාසිකාව:** ආත්මය කියලා එකක් නෑ ඉතිං.

**ආර්යන් වහන්සේ:** මේ දරුවා කියලා හිතනවා නම් දරුවා කියල හිතන සිතුවිල්ල විතරයි තියෙන්නේ. සිතුවිල්ල විතරයි තියෙන්නේ. එතකොට මේ කය කියල හිතන සිතුවිල්ල විතරයි තියෙන්නේ.

**උපාසිකාව:** ඔව්.

**ආර්යන් වහන්සේ:** මේ මහත්තයා කියලා හිතන සිතුවිල්ල විතරයි තියෙන්නේ. මේ ගෙදර දකින හැම එකම සිතුවිල්ල විතරයි. දැන් ආත්මය කෝ?

**ආර්යන් වහන්සේ:** දැන් ආත්මය කෝ?

**උපාසිකාව:** ආත්මය

**ආර්යන් වහන්සේ:** ආත්මයක් නැහැ. අනාත්ම ධර්මය හමුවෙනවා.

**උපාසිකාව:** ආත්මයක් නැහැ. අපි අර ආත්මයක් කියලා දාගෙන කාලයක් තිස්සේ හිතපු නිසා.

**ආර්යන් වහන්සේ:** ඒක අර ආත්මය කියලා හිතපු එක නිසා ආත්මය කියලා හිතපු සිතුවිල්ලක් විතරයි.

**උපාසිකාව:** සිතුවිල්ලක් විතරයි.

**ආර්යන් වහන්සේ:** මේ ඔක්කෝම සිතුවිල්ලක් පරිහරණය කරන්නේ මේ සිතුවිල්ලක් කියලා පේනවා. එතකොට මේ සිත ඒකයි කිව්වේ පොත කියලා, දරුවා කියලා හිතන සිත එච්චරයි. ඒ හිතන එක එච්චරයි. මනෝ සෙන්සර් එකෙන් එන චිත්ත සෙන්සර් එකත් එච්චරයි. සිතක් ඇතිවෙනවා නැතිවෙනවා. ස්පාක් එක කියන්නේ අර ඇස, කන, දිව, නාසයෙන් අර පුංචි දරුවා ඉපදෙන කොට මනෝ සෙන්සර් එක ගැන කතාවක් නෑ. එතකොට අපි කතා කරන්නේ ඇස, කන, දිව, නාසය ඇසට වර්ණ, ශබ්ද ඒවා එකතු වෙලා මනෝ සෙන්සර් එකක් හැදුණා. ඊට ප්සසේ එතනිනුත් එනවා දැන් ඒක ස්පාක් වෙනවා නැවත නැවතත්. එතකොට මේ සේරම ස්පාක් වේවී තියෙනවා. දැන්, හැබැයි ස්පාක් එක නවතිනවා. බලනකොට මේ ආශ්වාස ප්‍රාශ්වාස නවතින කොටම අන්න අර සෙන්සර්ස් ටික ඉවරයි.

**උපාසිකාව:** ස්පාර්ක් වෙන ටික ඉවර වෙලා යනවා.

**ආර්යන් වහන්සෘ** ස්පාර්ක් වෙන්නෙත් නෑ. ආත්මයක් තිබිලත් නෑ. කවදාවත් හම්බවෙලත් නෑ.

මේ සිත කවදාවත් එළියට ඇවිල්ලා නෑ. දැන් ශබ්දයක් කොහේද එළියේ තියෙන්නේ? ශබ්ද, වර්ණ ඒවා එළියේ නෑනේ. ඒකත් බොරුවක් නේ.

**උපාසිකාවඃ** නෑනේ. බොරුවක් නේ.

**ආර්යන් වහන්සඃ** එතකොට මේ සිත කවදාවත් එළියෙ මොනවද තියෙන්නේ? **ශබ්ද වර්ණ** නෙමේනේ. එහෙම දෙයක් නෑ. ශූන්‍යයි කිව්වේ ඒකයි. **අනිමිත්තයි, අප්ප්‍රනිතයි** කිව්වේ. **චිත්ත විමුක්තිය** කිව්වේ සිතින් සිත මිදීම විඤ්ඤානය අනිදස්සන වෙනවා කිව්වේ ඔබතුමිය ඉර්දියෙන් යන්නේ දැන් ඔබතුමියට කිසිම දෙයක් හම්බ වෙන්නේ නෑ. ඔබතුමිය මෙතන ඉඳලා මෝහනය වෙලා වගේ ඉර්දියෙන් යන්නේ දැන් කොහේ හරි ගියොත්.

පොළව කියලා දෙයක් නෑ. කකුල කියලා දෙයක් නෑ. කය කියලා දෙයක් නෑ. දරුවා කියලා දෙයක් නෑ. මහත්තයා කියලා දෙයක් නෑ. ගේ කියලා දෙයක් නෑ. දකින දකින කිසි දෙයක් කොහේවත් නෑ. හම්බ වෙන්නෙත් නෑ. කාටද හම්බවුණෝ? හිතට හම්බ වුණාද?

**ආර්යන් වහන්සඃ** ඒකයි අපි කිව්වේ හිත තිබහයි කියලා හිතුවට හිත වතුර බිව්වේ නෑ. හිත බඩගිනි කියලා හිතුවට හිත බත් කාලත් නෑ. හිත ඇවිදිනවා කියලා හිතුවට හිත ඇවිදලත් නෑ. හිත මේ කය මමෙයි කියලා හිතුවට ඒක හම්බ වෙලත් නෑ. හිත දරුවොයි කියලා හිතුවට හිතට දරුවොත් නෑ. හිතට ගේ කියලා හිතුවට හිතට ගේත් නෑ. මේ හිතට කිසිවක් කවදාවත් හම්බ වෙලත් නෑ. ශබ්ද, වර්ණ ස්පාක් එකක් විතරයි සිත කියන්නේ. ශබ්දයක කොහෙන්ද දෙයක්? වර්ණයක කොහෙන්ද දෙයක්? සූර්යාගේ රස්නය වැඩිවෙලා දැන් අළු වෙලා ගියත් එකයි. ඇයි ඒ? දැන් බොරුව තේරුණා. මේ එකක් වත් නැති බව. පෘථිවියම අළු වෙලා ගිහිල්ලා. අභ්‍යවකාශයම විතරයි ඉතුරු වෙන්නේ. ඒක තමයි ඇත්ත. අපි හිතන ඒවා කොහේවත් නෑ.

**උපාසිකාවඃ** සත්‍යයි. හොඳමයි ස්වාමීන් වහන්සේ.

**ආර්යන් වහන්සඃ** ශූන්‍යතා අති ප්‍රබලයි

**උපාසිකාව:** ශූන්‍යතාව ඔව්.

**ආර්යන් වහන්සෑ:** පරම සත්‍යය කියලා දැනෙන කොට දරා ගන්න බෑ නේ. හිතා ගන්න බෑ. මේ මොකද වුණේ කියලා. ඇත්තටම දැන් මැරුණා වගේ නේ. දැන් ඔක්කෝම ආයතන මැරිලා නේ. දැන් සේරම මැරුණ නේ. දැන් පිරිනිවන් පෑවා නේ. දැන් පිරිනිවන් පාලා. දැන් සියල්ල ඉවරයි. දැන් කතකරණී වෙනවා. සියල්ල ඉවරයි අභ්‍යවකාශය විතරයි ඉතුරු වෙලා තියෙන්නේ. දැන් ඔක්කෝම කුඩු කරා. දරුවෝ නැති කරා. මහත්තයා නැති කරා, තමන්වත් නැති කරා, කයත් නැති කරා, පෘථිවියත් නැති කරා. දැන් අභ්‍යවකාශය.

**උපාසිකාව:** ඔව්.

**ආර්යන් වහන්සෑ:** ශූන්‍යතාව. අන්න සත්‍යයට අවධි වුණා. අන්න බුද්ධං සරණං ගච්ඡාමි. දැන් සරණක් නෑ. දැන් බුද්ධ ස්වභාවය. දැන් සරණ අවශ්‍ය නෑ. බුද්ධ ස්වභාවය. ඒ ස්වභාවයයි බුද්ධ. ආත්ම කතා නෑ. සත්ව පුද්ගල කතා නෑ. ලෝකයක් නෑ. විනෙය්‍යලෝකේ ලෝකෙන් මිදිලා සියල්ල  කතකරණී නේ. ඔයිට එහා දෙයක් නෑ. දැක්කද?

**උපාසිකාව:** ඔව්. දැක්ක ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සෑ:** කතා කරන්නේ මොනවද? කියන්නේ මොනවද? වචන මොනවද? ඔක්කෝම බොරු.

**උපාසිකාව:** බොරු.

**ආර්යන් වහන්සෑ:** ඔක්කොම බොරු ගොඩක්.

**උපාසිකාව:** මිනිස්සු අමාරුවේ නේ.

**ආර්යන් වහන්සෑ:** ඔබතුමිය රහත් වෙන්න ළඟයි වගේ.

**උපාසිකාව:** අනේ ස්වාමීන් වහන්ස.

**උපාසිකාව:** නෑ තේරෙනවා මෙතන මුකුත්ම නෑ. සත්‍ය මෙච්චරයි කියලා.

**ආර්යන් වහන්සෑ:** නෑ. නෑ. ඔබතුමිය ගැටගහලා වගේ මේ ටික කිව්වේ. ඔබතුමිය යන්න හදන්නේ ෆෝන් එක තියලා.

**උපාසිකාවඃ** සිනාසේ.

**ආර්යන් වහන්සඃ** නෑ. නෑ. බුදුන් වහන්සේගෙන් බණ අහනකොට බුදුන් වහන්සේ කියනවා තව චුට්ටක් හිටියා නම් එයා නිවන් දකිනවා කියලා. බුදුන් වහන්සේගෙන් බණ අහන කොට නැගිටලා යනවා. දැන් බුදුන් වහන්සේ සංඝයාට කියනවා මොහොතක් එයා හිටියා නම් එයාගේ පෙර අකුසලයක් නිසයි එයා නැගිටලා ගියේ. තව මොහොතක් හිටිය නම් එයා නිවන් දකිනවා කියලා. තේරුණාද?

**උපාසිකාවඃ** සාදු! සාදු! තේරුණා ස්වාමීන් වහන්ස. මට දැනුණා.

**ආර්යන් වහන්සඃ** මේක අවබෝධ කළයි කියලා මුකුත් වෙන්නේ නෑ. ඔය හැමදේම වෙනදා විදිහට වැඩ කරනවා. හැබැයි මේ අවබෝධය ඇතිකර ගන්න එක අමාරුයි. මේක ආයි කල්පයක් හිටියත් මේ රැවටිලි මායා ගුලියේ එලක් නෑ. මේ සත්‍ය අවසානයටම දැනගන්න ඕන. සත්‍ය ලෝකේ කුමක්ද කියන එක දැනිලා තියෙන්නෙ ඕන. ඒක දැනගෙන එයා ඕන දෙයක් කළාට කමක් නෑ. ඇයි ඒ එයා සත්‍ය දකිනවා.

**උපාසිකාවඃ** සත්‍ය දන්න නිසා.

**ආර්යන් වහන්සඃ** සත්‍ය දන්න කෙනාට රැවටිලි නෑ. අවිද්‍යාව නෑ. එයාව රවටන්න බෑනේ කාටවත්. අර දෙයියෝ මැව්වා කියලා.

**උපාසිකාවඃ** රවටන්න බෑනේ ස්වාමීන් වහන්ස. ඒක ඇත්ත.

**ආර්යන් වහන්සඃ** ඔබතුමිය ඒ අතින් හරිම භාග්‍යවන්තයි නේ.

**ආර්යන් වහන්සඃ** ඇත්තටම දැං ඔබතුමියට ගැටලු නැති වෙනවා.

**උපාසිකාවඃ** එහෙම ගැටලුවක් නැහැ ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** නැහැ. ධර්මයෙන් තිබ්ච්ච දේවලුත් ලිහලා යනවා.

**උපාසිකාවඃ** ඇත්තටම ස්වාමීන් වහන්ස මම ඔබවහන්සේ අහම්බෙන් තමයි Youtube එකට දේශනයක් ආවේ මම. මට අර මම මට මෙහෙම දෙයක් තිබ්බා. දේශනයක් අහලා අවබෝධය තිබ්බා. ඇහැව්වට පස්සේ කෙලෙස් නැති වෙන්නේ නෑනේ. මට තියෙන ප්‍රශ්නයක් තමයි සිහියෙන් දකිනවා විදර්ශනා කරලා ඒ වෙලාවට නිවෙනවා. නමුත් මගේ කෙලෙස් තියෙනවා කියලා මට දැනෙනවා. මගේ යාළුවටත් මම කියනවා. නෑ.

අපිට මොකක් හරි චූටි තැනක් හරි මඟහැරිලා හැම තිස්සෙම සිහියෙන් දැක්කා කියලා. ඒත් ආයි කේන්ති ආයිත් එනවා නේ. එහෙම දෙයක් තියෙනවා කියලා. මං කිව්වා මේක වෙන්න බෑ මොකක් හරි මෙතන අඩුවක් අපි අතර තියෙනවා කියලා. එතකොට එයා කිව්වා නෑ අක්කා මේ හැම තිස්සේම ඕක සිහියෙන් දකින කොට දකින කොට තමයි නැතිවෙලා යන්නේ.

රාග, ද්වේශ, මෝහ නැති වෙන්නේ කොහොමද කියන එක තමයි හිතේ තිබ්බේ. කොහොම නමුත් මගේ යටි හිත ඒක පිළිගත්තේ නෑ ස්වාමීන් වහන්ස. මේ හේතුඵල දහම බලලා ඉවර වෙලා ඒක නැති කර ගත්තා. ඒ වෙලාවට මිදුණට **රාග, ද්වේෂ, මෝහ** තියෙනවා කියලා තමන්ගේ හිතට තමන්ට මනේ ඒක දැනෙන්නේ. ඉතිං ඒ හින්දා ඔහොම කාලයක් හිටියා. ඔහොම ඉන්න කොට තමයි, ඔබ වහන්සේගේ දේශනය මේකට පිළියමක් වෙන්න තමයි මං හිතන්නේ හේතු හැදෙන්නේ. ආවා මොකක් හරි හේතුවක් හින්දා මගේ සසර. ඔබවහන්සේගේ දේශනය අහන්න ගත්තට පස්සේ මට තේරුණා. නැවතිච්ච දා වගේ ගතියක් දැනෙන්න ගත්තා.

මේ කියනකොට චූටි චූටි අඩුපාඩු තැන්, ඇලෙන ගැටෙන තැන් ඉතිං ඊට පස්සේ මේ මේක හින්දයි කියන එක දේශනා එක්ක සෑහෙන ලිහිල් වෙලා ගිහින් ලිහෙන්න ගත්තා. මම මුලින්ම කතා කළේ මට භාවනා කරද්දී තිබ්බ ප්‍රශ්නයක්. භාවනා කරන උදේ පාන්දර හැමදාම මම පැය 1/2ක් භාවනා කරන එක තිබ්බ නේ. ඒ ඒක ඊට පස්සේ ඒක ලිහාලා ඔබවහන්සේ අර ගොඩක් ඉතිං යම්කිසි තැනක නතර වෙලා ඇවිල්ලා ඉඳලා සම්පූර්ණ පාර ටිකක්... අර ටැප් එකක් ඇරියම වතුර ගලා ගෙන ගියා වගේ ඔක්කෝම ටික. ඒක තමා මට දැනෙන්නේ.

**ආර්යන් වහන්සः** දැං අද වෙනකොට අන්තිම ටිකක් යනවා.

**උපාසිකාः** ඔව්. එහෙමයි.

**ආර්යන් වහන්සः** හිතාගන්න බැහැ. සම්පූර්ණ **අවිද්‍යා ශේෂ නිරෝධෝ කියන තැන**. ඒක කියන්නේ **අවිද්‍යාව තමයි අර දස සංයෝජන වල අන්තිමට අර අවිද්‍යා ප්‍රහීණය තියෙන්නේ. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, රූපරාග, අරූපරාග, මාන, උද්දච්ච, අවිද්‍යා. අවිද්‍යාව තමයි අන්තිමටම තියෙන්නේ.**

එතකොට අපිට තේරෙනවා **පටිච්ච සමුප්පාදයෙන් අවිද්‍යාව** තමයි ඇත්තටම කතා කරන්නේ. අවිද්‍යාව තියනකම් සසර ගමනක් තියනවා. **අපිට ධර්මශ්‍රවණය තුළ අවිද්‍යාව ප්‍රහීණ වෙන්නේ. ඒ කියන්නේ මේ සත්‍ය නොදන්න තාක් කල් අපි සසර දුකට වැටෙනවා.** ඒකයි **අපි කිව්වේ අර දර්ශන සමාපත්තිය සද්ධර්ම ශ්‍රවණය** තුළ **එයයි. මේකේ හිමාලය පර්වතය වගේ කෙලෙස් නැතිවෙනවා කියලා.** බුදුන් වහන්සේ කිව්වේ. **ආනන්ද මේ අතේ තියෙන ගල්කැටයද ලොකු මේ හිමාලය පර්වතයද විශාල කියලා අහනවනේ. එතකොට කියනවනේ ස්වාමීනි හිමාලය පර්වතය කොයිතරම් විශාලද අතේ තියෙන ගල්කැටය නොසැලකිය හැකිතරම් කියලා. අන්න ඒ වගේ ආනන්දය යමෙක් මේ බුද්ධ දර්ශනය අවබෝධ කළොත් හිමාලය පර්වතය වගේ කෙලෙස් ක්ෂය වෙනවා ආනන්ද.** ඒ කියන්නේ මේ **සත්‍ය දැනගැනීම තුළම ඇලීම, ගැටීම දිය වෙනවා. රාග, ද්වේෂ, මෝහ දියවෙනවා**. ඒක ඔබතුමියටම දැන් දැනෙනවා ඇති.

මහත්තයත් නැති අර ඔබතුමියව අර අතින් අල්ලගෙන ගමනක් අරන් යනවා වගේ. සුරංගනා කතාවක් වගේ. මහත්තයත් නැතිවෙලා. ඔය පොඩි තැනින් පටන් අරගෙන, මේ පොත නැති වෙන එක කිය කියා ගිහිල්ලා එකපාරටම කිව්වනේ දරුවත් නැතිවෙලා, මහත්තයත් නැතිවෙලා, ගෙවල් දොරවල්, මේ භය නැති කරපු හැටි බලන්න. මේ ඇඟිල්ලක් කපනවා, මේ කකුල් දෙකම නැතිවෙනවා, අත් දෙකම නැති වෙනවා. ඒත් හිත තියෙනවා නේද කියලා නේද ඇහැව්වේ.

ඊට පස්සෙ කියනවා දැන් කෝ තමන්, තමන් කයද නෑනේ. එහෙනම් සිතනේ. එහෙනම් මේ කයෙන් පළක් නෑනේ. දැන් මේ සිතනේ, එහෙනම් මේ සිතේ ආත්මයක් තියනවද? අන්න ඔන්න ඔතනින් තමා හිරවෙන්නේ.

**උපාසිකාව:** හිතේ ආත්මයක් නෑ. අන්න එතන හිරවෙන්නේ හිතේ ආත්මයක් නෑ.

**ආර්යන් වහන්ස:** ඊට පස්සෙ කොහේද මේ ශබ්දයයි, වර්ණයයි කියලා ගත්ත ගමන් සිතක් නෑ. ආත්ම කතාවකුත් නෑ. මේ හිතපු එකක්වත් නෑ. මේ ඔක්කෝම කුඩු වෙලා ගිහිල්ලා. අන්තිමට කිව්වහම මුළු පෘථිවියම කුඩු වෙලා. අභ්‍යවකාශය විතරයි ඉතුරු වෙන්නේ කිව්වමනේ, ලෝක

විනාශය පෙන්නුවහම පෘථිවියත් අළුවෙලා අභ්‍යවකාශය විතරයි තියෙන්නේ ඒකනේ කතාව.

**උපාසිකාව:** අවකාශ ධාතුව විතරයි.

**ආර්යන් වහන්සෑ:** ඒකනේ කතාව. අපි හිතන ඒවා ඔක්කෝම බොරු වෙන්නේ ඒකනේ. ඒකනේ කිව්වේ හිත තිබහයි කිව්වට හිත වතුර බිව්වෙ නෑ. හිත බඩගිනියි කිව්වට හිත බත් කෑවෙත් නෑ. හිත ඇවිදලයි කිව්වට හිත ඇවිදලත් නෑ. දරුවා ඉන්නවා කිව්වට හිතට දරුවෙක් ඉඳලත් නෑ. හිතට මහත්තයා ඉන්නවා කිව්වට හිතට මහත්තයෙක් ඉඳලත් නෑ. හිතට කවුරුත් නෑ. හිතනවා විතරයි.

**උපාසිකාව: හිතනවා විතරයි සංඥා, වර්ණ විතරයි.**

**ආර්යන් වහන්සෑ:** ශබ්දයක කොහෙන්ද කෙනෙක්. වර්ණයක කොහෙන්ද දෙයක්. ශබ්ද වර්ණ කුඩු වෙලා ගියාට පස්සේ ආත්ම සංඥාවක් නෑ. මේ සිත මේක නැවත නැවත කතා කරනවා කියන්නේම ඔබතුමිය නිකන් මෝහනය වෙලා වගේ රහත් භාවයට පත්වෙනවා. මේක හය පාරක් කිව්වොත් තව තව යනවා ඔතන්ට කිඳා බසිනවා. මේක දහ පාරක් කිව්වොත් තව තව කිඳා බසිනවා. මේ දේශන කොහේ හරි දැම්මොත් නැවත නැවත ඇහුවොත් රහත් භාවය කරාම යනවා.

**උපාසිකාව:** සාදු! සාදු! සාදු!

**ආර්යන් වහන්සෑ:** දැනෙනවා නේ කියන කොට. කියන කියන හැම මොහොතේම ඔබතුමියට සාදුකාර දෙනවා නෙමේ දෙවෙනවා. ඇත්තටම සාදු කියනවා නෙමේ සාදුකාර දෙවෙනවා.

**ආර්යන් වහන්සෑ:** පුදුමයි නේ. මේ දහම මෙහෙම අහන්න ලැබෙන එකත් ලොකු දෙයක්.

**උපාසිකාව:** නැත්නම්. මේක නම් පුදුම පිනක්.

**ආර්යන් වහන්සෑ:** මේ දහම ඇහුණාට පස්සෙ මහත්තයා නැති වුණාට අඬන්නේ නෑ. ළමයා නැති වුණාට අඬන්නේ නෑ. අපිට මේ බුදුසමයෙන් අහන්න ලැබෙනවා. සමහර සිටු දියණිවරු දානේ දෙන කොට මහත්තයයි ළමයිනුත් සේරම යුද්ධයේදී නැතිවුණා කියලා පණිවුඩය එනවා කියලා. ඒ කොළ කෑල්ල බිම වැටෙනවා කියලා. ඊට පස්සේ ඒක ඉනේ ගහගන්නවා.

හැබැයි පීරිසිය බිම වැටෙනවා. ඊට පස්සේ පීරිසිය බිම වැටුණා එක එයා කම්පා වෙන්නේ නෑ. ඊට පස්සේ තමයි කියන්නේ මේ පීරිසිය නම් මොකක්ද? මේ දැන් දරුවොයි, මහත්තයයි සේරම නැති වුණා කියලා පණිවුඩේ ආවේ කම්පා වුණේ නැහැ ස්වාමීනි කියනවා. බලන්න නේ.

**උපාසිකාව:** කම්පා වෙලා පළක් නෑ ඉතිං.

**ආර්යන් වහන්ස:** දැන් ඔබතුමියගේ හිතට කොහෙන්ද මහත්තුරු මෙච්චර කල් හිතනවා විතරයි. මේ එයාගේ රූපය, මේ එයාගේ කය, එයාගේ උණුසුම සීතල තද ගතිය. ඒත් හිතනවා විතරයි. සිතුවිල්ලක් විතරයි.

**උපාසිකාව:** ඔක්කෝම සිත

**ආර්යන් වහන්ස:** සිතුවිල්ලක් විතරයි. මේ මම කියලා දෙයක් නැති කොට වෙන මොනවද තියෙන්නේ.

**උපාසිකාව:** ඒකනේ කොහේද සිතක්.

**ආර්යන් වහන්ස:** මේ මමද? ඔබතුමියට තව ගෙදර ගියාමත් සිතෙයි. හැම මොහොතේම සිතෙයි. **මේ කය මමද රූපං අත්තනෝ සමරූප්පස්සති.** ඒකයි කිව්වේ. **රූප අත්තං වා සමරූප්පස්සති.** ඒකයි අපි රූපය ආත්මය කියලා හිතන් ඉන්න අය තේරුණාද?

**උපාසිකාව:** තේරුණා ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්ස: අපි රූපය තුළ ආත්මයක් තියෙනවා කියලා හිතන් ඉන්න අය බුදුන් වහන්සේ කියන්නේ. එහෙම දෙයක් නෑ. ඒක සක්කාය දෘෂ්ටියක්. ඒක දෘෂ්ටියක්.**

**උපාසිකාව:** ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්ස:** හොඳයි.

**උපාසිකාව:** තෙරුවන් සරණයි. ගොඩක් පිං ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්ස:** තෙරුවන් සරණයි.

මෙම දේශනය ඊළඟ දේශනාව හා සම්බන්ධ වේ. (දේශනා අංක 5)

# 3

# මට මම නැති වන හැටි

**ආර්යන් වහන්සෑ** කොහේද මෙහෙණින් වහන්ස

**මෙහෙණින් වහන්සෑ** මම හොරණ පරගස්තොට.

**ආර්යන් වහන්සෑ** ඔව් කියන්න.

**මෙහෙණින් වහන්සෑ** ස්වාමීන් වහන්ස මගේ අවබෝධය පිරිසිදු කර ගන්න තැන් කිහිපයක් සාකච්ඡා කරන්න සහ ඔබවහන්සේට ගත්තේ අවසරයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** කියන්න.

**මෙහෙණින් වහන්සෑ** භාවනාවයි, ප්‍රායෝගික ජීවිතයයි දෙකක් නෙවේ කියන එක මගේ ගුරු දේවයන් වහන්සේගේ අනුශාසනා වලින් මට යම්කිසි අවබෝධයක් ලැබිලා තිබුණේ.

**ආර්යන් වහන්සෑ** නැවත කියන්න.

**මෙහෙණින් වහන්සෑ** මම එතන අදහස් කළේ භාවනාව අපට අවශ්‍යයි. ඒත් දිගින් දිගටම භාවනාවෙන් පමණක් නිවන් දකින්න බැහැ කියන එක. ඒක ප්‍රායෝගික ජීවිතයත් එක්ක සිදුවෙන්න ඕන කියන එක.

**ආර්යන් වහන්සෑ** ඔව්. ඒක හරි. භාවනාවයි, ප්‍රායෝගික ජීවිතයයි 2ක් වෙන්න බැහැ. ඒවා වචන ගොඩක් විතරයි. එහෙම භාවනාව වෙනම දෙයක්. මේ මාර්ගය තුළ හමුවෙන්නේ නෑ.

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** හැබැයි අපි ඔය භාවනාව කියලා වෙන් කරන්නේ ඔය **සමථය** තුළ අප පස්වග තවුසෝ කරපු දේවල්. අපි බුදුසමය තුළත්

භාවනාව කියලා ඒ දේ තමයි තිබ්බේ. මේ **විදර්ශනාවත්** එක්තරා දුරකට බැලුවොත් ඒක භාව ස්වරූපයක් තමයි. සමාජ සම්මුතිය තුළ භාවනාව කියන්නේ ඔය **අත්දෙක තියන් පර්යන්කේ පලඟ බැඳගෙන ඉඳන් සමථය වඩන එකට තමයි.** දැන් ධර්මය ශ්‍රවණය කරන කොට කාට හරි කියන කොට **සම්ප්‍රේෂණය** කරන කොට **සන්නිවේදනය කරන කොට භාවනාව තමයි ගන්නේ. අර පලඟ බැඳගෙන භාවනාව තමයි** ගන්නේ.

**ආර්යන් වහන්සඃ** එය ඒ අය හිතනවා නිසා මේක වෙනස්ම කෝණයකින් භාවනාව දෘෂ්ටිගතව දකිනවා. ඒ අය හිතනවා සතර ඉරියව්වෙන්ම භාවනා කරනවා කියලා හිතනවා. සතර ඉරියව්වෙන්ම නෙමේ. සතර ඉරියව්වෙන්ම **සත්‍ය දකින එකත් තමයි විදර්ශනා භාවනාව** කියන්නේ. බුදුන් වහන්සේ මේ ලෝකෙට පැහැදිලි කරන්නේ විදර්ශනා භාවනාව. විදර්ශනා භාවනාව තමයි **පටිච්ච සමුප්පාදය** මෙනෙහි කරලා බුදුන් වහන්සේ **පටිච්චසමුප්පාදය** මෙනෙහි වීම් තුළ යථාභූත ඥාණය, සත්‍ය ඥාණය හමුවෙන්නේ. ඒක විදර්ශනා භාවනාව.

ඒක සතර ඉරියව්වෙන්ම තියනව. ඒක වෙනමම වේලාවක් කියලා හිතන එකක් නෙමේ. සිතට සිහිය පැවැත්වීම හිතලා කරනවා නෙමෙයි. ඒක අභ්‍යන්තරයෙන්ම ගොඩනැගෙන **සම්මා සතියක්** පිහිටවනවා. **සති සම්පජන්නය** කියන එක. ඒක කාටවත් හිතලා නැති කරන්නත් බෑ. ඒ කියන්නේ ඒවා හිතලා වෙනස් කරන්න පුළුවන් දේවල් නෙමේ. **විඥ්ඥාණ මායාවට** ගෝචර නොවන ඉතාම ඊට වැඩිය ගැඹුරු පර්යායක් තියෙන්නේ.

**ආර්යන් වහන්සඃ** ඇත්තටම මේ ඥාණයන් කියන ඒවා හිතලා ගන්න බෑ. හිතලා කරන්න පුළුවන් දෙයක් නැති ගාණයි **ලෝකොත්තර භූමිය.**

**මෙහෙණින් වහන්සඃ** අවසරයි ස්වාමීන් වහන්ස, එතන හිතලා කරනව නම් එතන තමන් ඉන්නවනේ. මම ඉන්නවනේ එතකොට.

**ආර්යන් වහන්සඃ** හිතනවා කියන්නේ සිතුවිලි නේ. තමන්ම තමයි.

**මෙහෙණින් වහන්සඃ** එතකොට ස්වාමීන් වහන්ස භාවනාවේදී අපි ඒකාග්‍ර වෙලා ඉන්නවා නිසා එන සිතුවිල්ලෙන් සිතුවිල්ල දකින්න පහසුයි. ප්‍රායෝගික ජීවිතයේදී එතන්ටම අනුගත වෙන්න ටිකක් අමාරුයි.

**ආර්යන් වහන්සඃ** නෑ. නෑ.. ඒ කියපු දේ මොකක්දෝ දෙයක් තියෙනවා.

ඒ කියන්නේ ප්‍රායෝගික ජීවිතයේයි. භාවනා කරනවයි කියලා 2ක් නෑ. මේ මාර්ගය තුළ ධර්මයම බවට පත්වීමත් නිරායාසයෙන්ම සිද්ධ වෙනවා.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** ඒක කියන්නේ ඒක අමුතුවෙන්ම ඒක වෙන් කරන්න ඒක ප්‍රායෝගික ජීවිතෙයි, භාවනාවයි කියලා ඒක වෙන් කරන්න බෑ. දැන් සතර ඉරියව්වෙන්ම, ආනන්ද හාමුදුරුවෝ සක්මන් භාවනා කරන එක අත්හැරලා සැතපෙන්න යනකොට නේ රහත් වෙන්නේ.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සේ:** එතකොට කොහොමද එහෙනම් රහත් වෙන්නේ. **සතර ඉරියව්වෙන්ම මේ විදර්ශනාව** තියෙන්නේ. ඒක ප්‍රායෝගික ජීවිතයේ කියලා අපි කතා කරන වචනයක් වුණාට නම් අපි ප්‍රායෝගික කියලා කියන්නේ සාමාන්‍යයෙන් අපි එදිනෙදා කරන කටයුතු ඕනම එකයි කිව්වේ. මේකට ඉරියව්වක් නෑ කියලා. ආනන්ද හාමුදුරුවෝ රහත් භාවයට පත්වෙන ඉරියව්වක් නෑනේ.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** දැන් මේක සතර ඉරියව්වක් නෑ කියන්න හේතුවක් තමයි, සිතක් කොතනද ඒ සිතේ මිදීමක් තියෙනව නම්, ඒ හිත තියන තැනක් තියෙනවද? ඒ හිත තියන ඉරියව්වක් තියනවද? නෑ.

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ස්වාමීන් වහන්ස. එතන මම අදහස් කළේ ප්‍රායෝගික ජීවිතයේ සිත එතනට අනුගත කරන්න. සිතුවිල්ලක් ආවහම පෙර මතකයෙන් ආපු **අතීත විඤ්ඤාණයක්** හටගැනීමක් කියන එක හැම වේලාවෙම එතනට ගන්න අමාරු කියන එක.

**ආර්යන් වහන්සේ:** එහෙම ගන්න අවශ්‍යතාවක් තියනවද?

**මෙහෙණින් වහන්සේ:** මට ඒ වගේ අවබෝධයක් ආවේ එතකොටයි. එතැනින් මිදෙන්න පුළුවන් කියන එක.

**ආර්යන් වහන්සේ:** නෑ. නෑ.. ඒ වගේ අවබෝධයක් නෙමේ. ඒ වගේ දෘෂ්ටියක් ඇතිවෙලා තියෙනවා. අපිට කියන්න පුළුවන්.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි, එහෙමයි.

**ආර්යන් වහන්සඃ** ඒ කියන්නේ මෙතන පෙර මතකය කියලා දෙයක් නෑ. නමුත් අපි ධර්මය පැහැදිලි කරන කොට එකපාරටම කෙනෙකුට තේරෙන්නේ නෑනේ. ඒක නිසා අපි කියනවා **හතරමහ භූත** කියලා. මේක පෙන්නන්න ක්‍රමයක් ඕන නේ. **හතරමහභූත** කියලා කතා කරනවා. නමුත් **හතරමහ භූත** කියලා දෙයකුත් නෑ. අපි මේ වචන භාවිත කළාට මේ වචන වල ඇත්තක් නෑ. පෙර මතකය කියලා කතා කළාට පෙර මතකය කියල දෙයකුත් නෑ. වචන කිව්වට කමක් නෑ. හැබැයි මෙහෙණින් වහන්සේ අවබෝධය තියෙන්නත් ඕන නේ. මෙහෙණින් වහන්සේ කියපු විදිහට නම් වැටහුණා පෙර මතකය කියලා දෙයක් තියෙනවා වගේ දෙයක් තමයි ප්‍රකාශ කළේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සඃ** මේ මොහොතේ දකින එක මේ මොහොතට සීමා වෙන්නේ පෙර, පසු නොවී ඒ කියන්නේ **අවුත්වා සම්භූතං** කියන කොට **උත්තානං භවිස්සති කියන කොට** පෙර නොතිබීමයි හටගන්නේ.

**මෙහෙණින් වහන්සඃ** අවසරයි ස්වාමීන් වහන්ස. අපි පොත කියලා අර ගත්තොත් **අතීත විඤ්ඤාණයකින්** නැවත හටගැනීමක් කියලා.

**ආර්යන් වහන්සඃ** එහෙම දෙයක් නෑ. **අතීත විඤ්ඤාණය එතන නිරුද්ධ වෙලා ඉවරයි. අතීත විඤ්ඤාණයෙන් මේ විඤ්ඤාණය තියනවා කිව්වොත් ඒක ධර්මයට පටහැනියි.** ඇයි විඤ්ඤාණය කියන්නේ අපි "මහ නිදාන සූත්‍රයේ" පෙන්නුවත් එක්ක.  එතනම හටගෙන නිරුද්ධ වෙන ධර්මතාවයක්. මේක වෙන්නේ ස්පාක් එකකට. ස්පාක් කොහේද තියෙන්නේ. කලින් වෙන ස්පාක් එක ඉවරයි නේ.

**මෙහෙණින් වහන්සඃ** ස්වාමීන් වහන්ස එතන මට පටලැවිල්ලක් වෙලා තියෙන්නේ. අවබෝධ වෙන විදිහට.

**ආර්යන් වහන්සඃ** එච්චර දෙයක් නෙවේ ඒක. ඒක පිරිසිදු කර ගන්න. අපි හැමෝම පටලැව්ච්ච අයනේ. දැන් ඔය පටලැවිලි ලිහාගෙන තියෙන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. දැනුම අර ගන්නවනේ අපි නිතරම ඉස්සරහට.

**ආර්යන් වහන්සේ:** ඔව්. ඒක තමයි පටලැවිල්ල.

**මෙහෙණින් වහන්සේ:** ඒක මට පටලැවිලා තියෙන්නේ. ඒ බව තේරුණා.

**ආර්යන් වහන්සේ:** මෙහෙණින් වහන්සේ එතන සකස් කරගන්න වෙනවා. දේශනය අහන්න ඕනේ. ඒ කියන්නේ **ඛජ්ජනිය සූත්‍රය** ඇහුවත් ඔතන තමයි පැහැදිලි කරන්නේ. ඛජ්ජං ඛජ්ජං කියන්නේ කලින් එක කනවා කියන එක. කලින් එක කනවා නෙමේ, දැං එකක් කනවා කියලයි කියන්නේ. **"ඛජ්ජනිය සූත්‍රය"** නැවත අහන්න. එතනදි **"රුප්පන්තිකෝ ආවසෝ රූපං"** කියන එක රුප්පණය නිසා නැවත නැවත ස්පාක් එකක් වේගය නිසා දෙයක් කියලා පෙන්නනවා කියන එක.

එතනදි වෙනම පෙන්නන්නේ අර කලින් තිබුණු පෙර මතකය කියලා එකක් නෑ කියන එක. **"ලොවම දෙදරයි"** කියන එකත් අහන්න පුළුවන්. **ගොඩක් අය හිරවෙන තැනක් ඔය. ධර්ම මාර්ගයේ යන අයත්, එක තැනක් හතර මහා භූත, තව තැනක් පෙර මතකය කියන තැන** ධර්මයේ එතනින් ගැලවුණේ නැත්නම් ඉස්සරහට එන්න බෑ. එතකොට එයා **විඤ්ඤාණ මායාව ඇතුළෙත් හිරවෙනවා. කලින් තිබුණු විඤ්ඤාණය දැනුත් තිබ්බා වෙනවා. ඇත්තටම කිව්වොත් එයා මඟ නොමඟ පැටලෙන තැන** "පටිසංඛාර ඤාණය" එතන සකස් කර ගන්න ඕන. සැක සංකා තියෙන්න බෑ.

**මෙහෙණින් වහන්සේ:** තිබුණේ නැතිනම් නැවත හටගන්න බෑනේ.

**ආර්යන් වහන්සේ:** මොකද්ද වෙන්නේ කියලා දන්නැත්නම් ඔය දෘෂ්ටිය නැති කරන්න බෑ. මේක මුල ඉඳන් **පුබ්බේ නිවාසානුස්සති ඤාණයයි. චුතූපාද ඤාණයයි** එකට හොඳට ගළපපු කෙනෙක් විතරයි ඔය හරියටම ගෑවිලා කුඩු වෙලාම යන්නේ. **පුබ්බේ නිවාසානුස්සති ඤාණයෙන් පෙන්නුවේ පෙර සිත් කඳ පිළිවෙළ හැදෙන හැටි "ජාතිධම්ම සූත්‍රය" ඒක මව් කුසේ ඉඳලම අරගෙන පෙන්නුවා මහා නිදාන සූත්‍රයේ. ඒ කියන්නේ මේ සිත් කඳ පිළිවෙළ කොහොමද හටගත්තේ කියන එක. ඒක දැක්කොත් එයාට පේනවා ප්‍රභාස්වර සිතේ මුකුත් නෑ.**

**ආර්යන් වහන්සේ:** එහෙනම් එතන පෙර මතකයක් ගන්න බෑ. එහෙනම් ඒ දරුවා ඉපදෙන කොටම දන්නවා වෙන්න ඕන. එහෙම දෙයක් නෑ. එතකොට තේරෙනවා ඒක එතන එතන සකස් වෙන දෙයක් තමයි තියෙන්නේ.

මෙතන අපිට කොහොමද පොත කියන එක එන්නේ. එතකොට මේ පොත කියන එක ඉපදෙන කොට තිබුණේ නෑ තමයි. ඊට පස්සේ මොකද වෙලා තියෙන්නේ. අර වේගයෙන් මේ ස්පාක් එක දිගටම සිද්ධ වෙනවා. ඒක තුළ ආරෝපණයක් එනවා. ඒ ආරෝපණය තමයි අර වේගය තුළ උපමාවකින් පෙන්නනව නම් කාටුන් එකක් හදන කොට පින්තූර ගොඩක් වේගයෙන් හදන කොට දුවන ළමයෙක් පේන්නේ චිත්‍රපටිය වගේ කැමරා එකෙන් ෆොටෝ එකක් ගන්නවා. ඊට පස්සේ වේගයෙන් යනකොට ෆිල්ම් එකක් පේනවා.

ෆිල්ම් එක ඇතුළේ පළවෙනි පින්තූරේ විතර නම් තිබ්බේ ෆිල්ම් එකක් නෑ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** එතකොට මේ පින්තූර ගොඩාක් ආවහම තමයි ෆිල්ම් එක තියෙන්නේ. ඒකේ තේරුම තමයි ඉර, හඳ පොත තියෙනවා කියලා. අපිම අර ෆිල්ම් එක කියන්නේ ත්‍රිමාණ වෙලා. **ඇත්තවීම තමයි චිත්තාරෝපණය** කියන්නේ. **චුම්බක ආරෝපණය, විද්‍යුත් ආරෝපණය, චිත්තාරෝපණය කියන එක ගොඩක් අයට තේරෙන්නේ නෑ. ශබ්ද, වර්ණ, වලින් තමයි හැදිලා මුසුවෙලා තිබෙන්නේ. ශබ්දයක් දුන්නොත් වර්ණයක් එනවා. ඒක චිත්තාරෝපණය ඇතුළෙන් එන්නේ.**

**ආර්යන් වහන්සඃ** එතකොට අපි චුම්බක ශක්තිය ගත්තොත් ඕනෑම තැනක ගලක් උඩ දැම්මොත් බිම වැටෙනව නේ. එතකොට ඕනම දෙයක් දිහා බලන කොට ආරෝපණ ලාටුව, ආත්මීය ලාටුව ගෑවෙනවා.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සඃ** ආත්මීය ලාටුව ඔක්කෝම ට්‍රිලියන ගාණකින් තමයි හැදිලා තියෙන්නේ. ඉර තියෙනවා කියලා අපි බිම බලන් හිටියත් අපි දන්නවා.

**ආර්යන් වහන්සඃ** අහස බලන් හිටියත් පොළොව තියන බව දන්නවා. බිත්තිය බලන් හිටියත් ගස් කොළන් තියන බව දන්නවා. ඒ කියන්නේ අපේ දැනුම. හැම ශබ්දයකටම වර්ණයක් තියෙනවා. හැම ශබ්දයටම රූපයක් තියෙනවා. හැම රූපයකම ශබ්දයකුත් තියෙනවා. මේවා අපි ඉපදෙන කොට තිබුණේ නෑ. **ශබ්ද වලට රූප එකතු වෙලා** එකතු

වෙලා කරන්ට් එක පොඩ්ඩ පොඩ්ඩ වැඩි වෙලා ලොකු කරන්ට් එකක් හැදෙන්නේ. අන්න ඒ වගේ.

අපි කිව්වේ බයිසිකල් ඩයිනමෝර් එක වගේ චාර්ජ් වෙනවා කියලා. මේක ඔටෝ චාර්ජ් වෙනවා. එතනම එතනම අභිසංකරණයක් වෙනවා. එතැනින් අපිට ආත්මීය දැනීම ඇතිවෙලා තියෙනවා. ඒ ආත්මීය දැනීම තුළ මම ඉන්නවා. දැන් බැලුවහම මම කියන්නේ ශරීරය. ඒ ඔක්කෝම ඇත්ත දකින කොට ඒවා නැති වෙනවා. බැලුවහම එහෙම දෙයක් ඇත්තටම නෑ. **මම කියන්නේ සිතුවිල්ලක්.** හිතන එකක්.

**ආර්යන් වහන්සේ:** මේ හැම එකම **විඤ්ඤාණ මායාවක්මයි**. ඒ මොහොතේම මායාව සකස් වෙනවා. ඒක වෙලා තියෙන්නේ ඒක පස්සට යන්නේ නෑ ඉස්සරහට යනවා. මොකද්ද ඒ **අභිසංකරණයක්. අනුසෝතය** කියන්නේ තියන එකට තව එකතු වෙනවා. අලුත් වෙවී අලුත් වෙවී එකතු වෙනවා. අලුත් වෙලා ඝන වෙලා ඝන වෙලා තණ්හාව, ඉරිසියාව, වෛරය, ක්‍රෝධය ඇතිවෙනවා. විශාල ඝන සංඥාවක් හැදෙනවා. ලෝකේ තියනවා කියලා බැස ගන්නවා. ගලවන්න බෑ. ඊට පස්සේ මැරෙන්න බෑ

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** ඒ කියන්නේ නැති වෙන බවට දරා ගන්න බෑ. ඒක තමයි දුක කියන්නේ. නමුත් මේ **විඤ්ඤාණ මායාව** ඇතුලේ හදන එකක් වත් කොහේවත් නෑ. නමුත් මේවා නැතිවෙන බව හැම මොහොතේම දැනෙන්න ගන්නවා. එතකොට දුක ඇතිවෙනවා. දුක කියන්නේම තියනවා කියලා ගත්ත කමේ **ආත්මයේ ප්‍රතිවිරුද්ධ** කාසියේ දෙපැත්ත තමයි මාරයා. **ආත්මීය දැනීම** අනික් පැත්ත තමයි මරණය. එහෙනම් ආත්මයක් නැත්නම්, කෙනෙක් නැත්නම්, මැරෙන්න කෙනෙකුත් නෑ. එහෙනම් මේ එක පැත්තක් හැදෙන කොට අනිත් පැත්තත් හැදෙනවා. තියෙනවා කියලා දැනෙන දැනීම තුළයි ලෝකයක් බැස ගත්ත, අර **ශබ්ද, වර්ණ** එකතු වෙලා අර **ආරෝපණයක්** කරන්ට් එකක් වගේ උපදිනවා. මිලිවොට් 5 කරන්ට්.

**ආර්යන් වහන්සේ:** එය ස්නායු පද්ධතිය ඔස්සේ දුවනවා. කේන්තියක් ගියොත් ඒ එන ශක්තිය වැඩි වෙනවා. **සිතුවිල්ල බලගැන්වෙනවා. ඒ බලගැන්වෙන චිත්ත ශක්තියම තමයි කරන්ට් එක ස්නායු, පද්ධතිය තුළ**

**දුවන්නේ. චිත්ත ශක්තියයි.** ඒක කරන්ට් එකක් වගෙයි. ඒක කොහේවත් තියන එකක් නෙමෙයි. ඇතුළේ ජෙනරේට් වෙනවා. මෙන්න මේ ලෝකයක් තියනවා කියලා දැනෙන **ආරෝපණ ශක්තිය** අපිව නැවත සකස් වෙන්න හේතු වෙනවා. ඕක **frequence** වගේ වෙනවා.

මේ දේශන එකකට එකක් අත්හරින්න බැරි විදිහට යනවා. මේ දේශන අහගෙන අහගෙන යන වෙලාවට ඉන්න පිරිසක් හැදීගෙන එන බව අපට පේනවා. ඒ අය 500, 1000, 7000 වෙන්නත් පුළුවන්. අපිට ඒක අදාළ නෑ. අහගෙන එන අය නිවන් දකිනවමයි.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස. සාදු! සාදු! සාදු!

**ආර්යන් වහන්සඃ** ඒ වාසනාවට ඒ භාග්‍යයට තමයි ඒ අය අහගෙන එන්නේ. ඒ අයට ඒක දැනෙනවා. ඒ අයට ප්‍රත්‍යක්ෂ වෙනවා දිගටම යනවා.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. මම ඔබ වහන්සේගෙන් ඇහුව්වේ දර්ශනය සමාපත්ති 5, ක්‍රියා සිතුවිලි නැති සිත එකෙන් තමයි ස්වාමීන් වහන්ස මං ගොඩක් පිරිසිදු වුණා ඒ තැන්.

**ආර්යන් වහන්සඃ** අපි එක පඩි පෙළක් නඟින කොට ඔය දේශනාව අහගෙන ගිය දර්ශන සමාපත්ති 5 එක එකේ එක්තරා ස්ටෙප් එකක් එතන තියෙන්නේ. අවසාන එක අහන කොට වෙන්නේ එතකොට සිද්ධ වෙන්නේ පඩි පෙල් ගාණක් ගිහින් ආයිත් උඩ පඩියට එනවා. එතන දර්ශන සමාපත්තිය 5 දි පෙන්නන්නේ ධාතු ස්වභාවයක්. එතන කියනවා පෙර මතකයෙන් එනවා කියලා. එතකොට ඒ පඩියට එතනට ගැළපෙනවා. ධර්මයට එන්න බැරි කෙනාට තමයි අපි කියන්නේ පස්සට යන්න. එතකොට එයා ආයි ඒ ටික හදාගෙන ටික ටික එනවා. හැබැයි මේ එකපාරටම කියන කොට එතැන නෙවෙයි.

ඒකයි මෙහෙණින් වහන්සේ අහනකොට හැප්පුන තැන.

**මෙහෙණින් වහන්සඃ** අවසරයි ස්වාමීන් වහන්ස. මට තේරුණා.

**ආර්යන් වහන්සඃ** එතන සරල නිසා තේරෙනවා ගොඩාක්. මෙතන ගැඹුරු නිසා තේරෙන්නේ නෑ. එතකොට අතනටම තමයි යන්න හිතෙන්නේ.

**මෙහෙණින් වහන්සෑ:** එතන මට තේරුණේ **ප්‍රඥාවට** යනකොට ස්වාමීන් වහන්ස මුලදී පටන් ගන්න කොට ඇතුළට යන්න ඕන නිසා ආවට ඉස්සරහට යනකොට මට තේරුණේ සිතුවිල්ල ආපු තැනට එන්න ඕන විදිහ තේරුණේ මෙහෙමයි ස්වාමීන් වහන්ස. වැරැද්දක් තියෙනව නම්.

දැන් ස්වාමීන් වහන්ස මම පිණ්ඩපාතේ වඩින කොට ප්‍රත්‍යවේක්ෂාව කරමින් නේ වඩින්නේ. එතකොට ඒක පාලි භාෂාවෙන් තමයි සිද්ධ වෙන්නේ. පාලි භාෂාවෙන් මෙනෙහි වෙවී යනකොට ඒ වචන සිංහලෙන් ඇතුළෙන් ඒක අවබෝධයක් වගේ එනවා. මට එතකොට හිතුණා ස්වාමීන් වහන්ස රූපයක් දකින කොට ඒ වගේ තමයි දැනගන්න ඕන කියන එක. ඇතුළෙන් දකින රූපය හරියට අවබෝධ වෙන්න ඕන ඒ විදිහටයි කියන එක.

**ආර්යන් වහන්සෑ:** අපි මෙහෙම කියමු. පරිස්සමින් අහන්න ඕන. දැන් එතකොට මැරෙන්නේ කයද? සිතද?

**මෙහෙණින් වහන්සෑ:** සිතනේ ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සෑ:** සිත නැති නිසානේ කය වළලලා දාන්නේ. සිත හැම මොහොතේම ඇති වෙනවා. නැති වෙනවානේ.

**මෙහෙණින් වහන්සෑ:** එහෙමයි.

**ආර්යන් වහන්සෑ:** එතකොට පවතින සිතක් නෑනේ. සිතනේ මැරෙන්නනේ කියලා කිව්වා නේ නේද? එතකොට කය නිකං ගහ වගේ නේ. එතකොට කය භාවිතාවක් පමණයි නේ මෙතන තියෙන්නේ. සිතනේ හිතන්නේ මේ කය කියලා. අපි හිතන් ඉන්නවා නේද මේ කය මමයි කියලා.

**මෙහෙණින් වහන්සෑ:** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සෑ:** කය මමෙයි කියලා අපි හිතන් ඉන්නවා. ඇත්තටම මේ කය මමද? දැන් අපි බලමු ඇඟිල්ලක් කපනවා. දැන් මේ කැපුවේ මගේ ඇඟිල්ලක්ද? එතකොට අපි හිතමු කකුලක් කපනවා. දැන් මගේ කකුල කැපුවද? ඊට පස්සේ කකුල් දෙකම කපනවා. දැන් මගේ කකුල් 2 කපලද? ඊට පස්සේ අතක් කපනවා. දැන් මගේ අතක් කපලද? ඊට පස්සේ මගේ අත් 2 කපනවා. දැන් මගේ අත් 2 කපලද? කකුල් 2 කපලා

අත් 2 කපලලු. දැන් Youtube එකේ දාලා තියෙනවා සමහර වෙලාවට දකින්න ලැබෙයි. අත් 2 කකුල් 2 නැති අයත් ඉන්නවා. එතකොට ඇඟිල්ල මමෙයි කියලනේ හිතුවේ. මට ඇඟිලි තිබුණද? කකුල් තිබුණද? අත් තිබුණද? මට ශරීරයක් තිබුණද? මේ ඔක්කෝම හිතන එකක් තියෙන්නේ. මේ මමද කියලා ඇහුව්වේ ඒකයි.

කකුල් 2 කැපුවම අඩනවනේ. අත් 2 කැපුවම අඩනවනේ. ඇයි ඒ මම කියන්නේ එකක්වත් නෙමෙයි. එහෙමනම් ඔය දකින පොත මමද?

**මෙහෙණින් වහන්සඃ** නෑනේ. සිතුවිලි වලින් හට ගත්ත දෙයක් නේ තියෙන්නේ.

**ආර්යන් වහන්සඃ** එතකොට මම කොහේද ඉන්නේ. පොත කියල හිතුවොත් මම ඉන්නවා හිතුවේ නැත්නම් මම නෑ. ශරීරය මම කියලා හිතුවොත් මම ඉන්නවා. මේ ඔක්කෝම හිතන එකක් තියෙන්නේ. හැබැයි මේ ආයතන විඤ්ඤාණ, ශබ්ද, වර්ණ, ගන්ධ වලින් ඒ ස්පාක් වලින් තවත් එක් ස්පාක් එකක් විතරයි. පොත, මේසේ, ඇඳ මේ කය අපි සේරම හිතන එකක්. දෙයක් කියලා ගත්ත **මනෝ විඤ්ඤාණය.** එහෙනම් **මනෝ විඤ්ඤාණය එතන දෙයක් කියලා ඒ කියන්නේ ස්පාක් එක මනසට මේස, පොත, ඇඳන් කියලා හැදුණේ ශබ්ද වර්ණ ස්පාක් වෙලා. ඒකෙන් දෙයක් කියලා ගත්තොත් එහෙනම් මම ඒ අරන් තියෙන්නේ "ඒතං මම" ඒක දකින මම. "ඒසෝ හමස්සි ඒතං මම නමේසු අත්තා" අර හිතින් ගත්ත "රූපා රම්මරණය" දෙයක් කියලා ගත්ත ආරම්මරණයයි. ඒතං මම කියන්නෙ ඒක දකින මම. ආරම්මණය නැත්නම් රූපං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ කිව්වේ ඒ හිතට එන අරමුන ආරම්මණයයි. රූපාරම්මණ රූපෝ කියලා කිව්වේ රූපං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ කියන්නේ ශබ්ද, රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප. එහෙනං රූප කියන්නේ රූපාරම්මණය. යම් දෙයක් ද මේ මොහොතේ දකින්නේ. ඒ රූපාරම්මණයයි. ඒ ආරම්මණයයි. ඒ අරමුණයි. අරමුණයි සිත** කියන්නේ.

සිතට එන අරමුණ සත්‍ය දකිනවා කියන්නේ.

**ආර්යන් වහන්සඃ** ඒ **රූපාරම්මණය** කියන්නේ අන්න **රූපේ නිච්චතෝ අනිච්චතෝ කිව්වේ දෙයක් නැති බවයි. අනිච්චං භන්තේ කිව්වේ අපි**

**හිතන දේ බාහිර නෑ කියලා.** පොත කියලා අපි හිතපු ශබ්ද, වර්ණ වල එකතුව කොහේවත් නෑ.

දැන් මේ පෘථිවිය සූර්යාගේ රස්නය වැඩිවෙලා විනාශ වෙලා යනවා. එතකොට අභ්‍යවකාශය විතරයි ඉතුරු වෙන්නේ. දැන් මේ සිතට එන අරමුණු කොහේවත් නැත්නම් ශූන්‍යයි. **"නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ" නිමිති නෑ අනිමිත්තයි. ශූන්‍යයි අප්පුනීතයි.** සූර්යාගේ රස්නය වැඩිවෙලා විනාශ වෙලා යනවා. බුදුන් වහන්සේ දෙන උපමාව ගිතෙල් දැවුණු තැනක අර තෙලුත්, අලුත් ඉතුරු නොවන සේ නැතිවෙලා යනවා කියලා. ඒ විදිහට අභ්‍යවකාශය විතර නම් ඉතුරු වෙන්නෙ දැන් කෝ මම.

**මෙහෙණින් වහන්සඃ** මම කියලා කෙනෙක් එතන ඇත්තේම නෑනේ ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** මම... මම මේ මොහොතෙත් නෑ. මේ සිතුවිලි කොහේවත් නෑ.

**මෙහෙණින් වහන්සඃ** සිතුවිලි මේ චිත්තක්ෂණය තුළ ඇතිවෙලා නැතිවෙන දෙයක් නේ වෙන්නේ ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** නෑ එහෙම දෙයකුත් නෑ.

**මෙහෙණින් වහන්සඃ** එතන ටිකක් පැහැදිලි කරන්න ස්වාමීන් වහන්ස තව.

**ආර්යන් වහන්සඃ** හිතන එකම වැරදියි. හිතන දෙයකුත් නෑ. තමන්ට දැනෙන්න ඕන මේ සත්‍ය බවට ප්‍රායෝගික වෙන්න ඕන වටපිට බලන කොට ඒක දැනෙනවද කියලා සිහියක් පවත්වන්න. අර යථාභූතඥාණයෙන් නිතරම මෙනෙහි කරන්න.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** දැන් ප්‍රත්‍යවේක්ෂා කරනවා කියලා අපි මූලික අදියරේ අපි මොන්ටිසෝරි සහ .... A/L කරලත් අ, ආ, ඉගෙන ගත්තොත් මොකද වෙන්නේ? තමන් ඉන්න තැන තමන් දන්නේ නෑ. අනාගාමී කෙනා නැවත සෝතාපන්න වෙන්න උත්සාහ කරනවා. රහතන් වහන්සේ නැවත පෘථග්ජන වෙන්න උත්සාහ කරනවා. කවදාවත් කරන්න බෑ. එහෙම නැත්නම් යන්න වෙනවා පෘථග්ජන භූමියට. මුල ඉඳන්ම පටන් ගන්නවා.

**මෙහෙණින් වහන්සඃ** ස්වාමීන් වහන්ස ප්‍රත්‍යවේක්ෂාව සිදුවෙන්න ඕන විදිහ නැවතත්...

**ආර්යන් වහන්සඃ** ප්‍රත්‍යවේක්ෂාව කියන්නේ යථාභූත ඤාණය තියන කෙනාට කියන්න ඕන දෙයක් නෙමේ. "සංවරත්වේන සිලානම්" ඒ කියන්නේ මේ පැත්ත බලන කොට තමන් ඒක ඇත්ත කර ගත්තොත් තමන් ඒ ධර්මය නොදැක්කා කියලා.

**මෙහෙණින් වහන්සඃ** අවසරයි ස්වාමීන් වහන්ස. මට ඒක ආවා.

**ආර්යන් වහන්සඃ** ඇස, කන, දිව, නාසය, ශරීරය, මනස කියන ආයතන 6ම එනවා. එහෙනම් මේක දිවට විතරක් නෙමේ. දැන් මෙතනදි මෙහෙම දැන් අපි ආහාර ගන්නවා. රස දැනෙනවා. දිවට. දැන් මම කෝ?

**මෙහෙණින් වහන්සඃ** රස ගත්තොත් මම වෙනවා නේ එතන.

**ආර්යන් වහන්සඃ** රසය කොහොමත් දැනෙනවා. තමන්ට සිහියක් තියෙන්න ඕනෙ එතන තමන් නැති බව.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි.

**ආර්යන් වහන්සඃ** ඒක මම පිනවනවාද කියලා සිහිය තිබ්බොත් විතරයි අන්න එතනයි **"ජානතෝ පස්සතෝ"** තැන. අන්න එතනයි **ප්‍රභාස්වරයට අවධි** වෙලා අන්න **"ආසවක්ඛයා ඤාණයට"** අවධි වෙලා, අන්න යථාභූත ඤාණය තියන කෙනාට අන්න අවබෝධයක් එනවා **"සංඛිතේ නිබ්බිදාය" අවබෝධයෙන් නිවන් දකිනවා**. මේ ක්ෂණයෙ සිතට රස දැනෙන කොට ඒක මගේ වෙන්නේ නෑ. ඒක නිරායාසයෙන් වෙන්න ඕන. මුලින් අර ඉන්ද්‍රිය ධර්ම ශ්‍රද්ධා සත්‍ය දකින එක, වීර්ය ගන්න වීර්ය අර මෙහෙණින් වහන්සේ කිව්වා වගේ ප්‍රත්‍යවේක්ෂාව මුල් අවස්ථාව වීර්ය ගන්න අවස්ථාව. ඒක හිතලා ගන්න එකක්. ශ්‍රද්ධා, වීර්ය සතිය එතන අනිමිත්ත. අනිමිත්ත සමාධියයි. හිතට එන අරමුණ එන එන අරමුණ දැක මිදෙන එක සතිය එතන අනිමිත්ත සමාධිය. එතන "ප්‍රඥාව" ශ්‍රද්ධා වීර්ය සති සමාධි කියන්නේ පංච ඉන්ද්‍රිය ධර්ම කියන්නේ, ධර්මයක් විදිහට ශූන්‍යතාව වැඩෙනවා. දෙයක් නැතිවෙලා යනවා. **අනාත්ම ධර්මය එනවා**-

දැන් කය මම නෙමේ කිව්ව නම් මේ සිත නම් සිත කියලා දෙයකුත් නැත්නම් දැන් දකින පේන කිසිම තැනක දෙයක් හමු නොවෙනවා නම්

දෙයක් තිබ්බොත් ආත්මයක් තියෙනවා. දෙයක් නැත්නම් ආත්මයක් කියලා දෙයක් නෑ. ශබ්ද, වර්ණ වල ආත්මයක් කියලා දෙයක් හම්බ වෙන්නේ නෑ. එතකොට චක්ඛුං නිච්ච තෝ, චක්ඛුං කියන්නේ ඇස කියන්නේ පේන බවට. ඒත් රූපයමයි. **චක්ඛුං නිච්චතෝ අනිච්ච තෝ අනිච්චං භන්තේ කිව්වේ අපිට ඇස කියන්නේ පොත, මේස, ඇඳ, දුව, පුතා, ඉර, හඳ, පේන බව නම්, පේන බව කියන්නේ රූපයමයි. එහෙනම් එය රූපාරම්මණයයි.**

**චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ** කියලා සංඝයා වහන්සේලා පිළිතුරු දෙනවා. **එහෙනම් මහණෙනි එය දුක ද? සැප ද? දුක්ඛං භන්තේ. ඇස අනිත්‍ය නම් දුක නම් මහණෙනි එය ආත්ම වශයෙන් ගත හැකිද? "නෝ හේතං භන්තේ" අනාත්ම ධර්මය තුළ දෙයක් නෑ. "ඉදක්පච්චතාවය" කියන්නේ දෙයක් නෑ.** දෙයක් කියලා දෙයක් නැති මේ ධර්මය අති සියුම්. දැන් මේ කොහේවත් කවුරුත් ඉන්නවද? මේ කණ්ණාඩියෙන් බලලා රූපය මේ මමයි කියලා අපි හිතන් ඉන්නවා.

**ආර්යන් වහන්සඃ** ඒක සිතුවිල්ලක් විතරයි. සිතුවිලි කොහේවත් තියනවද? සිතුවිලි ඇත්තක්ද? නෑ. ප්‍රායෝගික වෙනවා කියන්නේ මේ දැනුමත් මුලින් එන්නේ "සංතුසමය ඤාණය" මෙහෙණින් වහන්සේ ප්‍රායෝගික වෙනවා කියන්නේ හැම මොහොතේම එතන, "තත්‍ර තත්‍ර විපස්සති" එතන එතන දකිනවා කියන එක දිවට විතරක් න දවායාතන, න මණ්ඩලායතන, න විභූෂණායතන විතරක් ඒකත් එක්තරා අවස්ථාවකදී අඳ බාල විදියට අපි කියනවා මොන්ටිසෝරි අ, ආ කිව්වෙ ඒකයි. අපි A/L කරන කොට ඔය ඔක්කෝම වචන ටික කියවන්නේ. එහෙනම් අපිට ගන්ධයටත් ඒක දැනෙනවා. අපිට රසට විතරක් නෙමේ ගන්ධයත්, උණුසුම සීතල තද ගතියටත් තමන් ඉන්නවද කියලා බලන්න ඕන. ඒක තමන්ට ඒ මොහොතේම දැනෙනවා. ටිකෙන් ටික තමයි දියුණු වෙන්නේ. තමන් නැති බවට. තමන් නැති බවට පරිහරණය වන ස්වභාවය තමයි අන්න මිදීමේ ස්වභාවය. අන්න ඡන්ද රාගය දුරුවෙන්නේ. ඒකට ඇලෙන ගැටෙන ස්වභාවය දුරුවීමයි. **"නිබ්බිධන්ති විරාගන්ති, විරාගන්ති නිරෝධන්ති" පටිනිස්සගානුපස්සි** ඒ ගමනයි. ඇහැට වර්ණයක් එනකොටත් තියෙනවා. ශබ්දයක් ඇහෙනකොටත් ප්‍රත්‍යවේක්ෂාව තියෙනවා. ගන්ධයක් දැනෙන කොටත් ප්‍රත්‍යවේක්ෂාව තියෙනවා. එහෙනම් රස දැනෙන කොට විතරක් නෙමෙයි උණුසුම, සීතග තද ගතිය දැනෙන කොට ප්‍රත්‍යවේක්ෂාවයි.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. හැමතැනකදීම වැඩෙනවා ප්‍රත්‍යවේක්ෂාව.

**ආර්යන් වහන්සඃ** මේ ප්‍රත්‍යවේක්ෂාව කියන්නෙ වචනයක් නෙමෙයි. වචනයකට කොටුවෙන එකක් නෙමෙයි. යථාභූත ඤාණය තියන කෙනාට නිරායාසයෙන් සත්‍යය දැනෙනවා. තමන්ට තියන සුතමය ඤාණයෙන්, යථාභූත ඤාණයේ ප්‍රමාණයට දැනෙන ඒ ප්‍රත්‍යවේක්ෂාව ඒ සත්‍ය අවබෝධ වන ප්‍රමාණයට ඒ කියන්නේ ඒ අවිද්‍යා අශේෂ ශේෂ නිරෝධෝ කියන තැනටයි යන්නේ. අවිද්‍යාව කියන්නේ බාහිර ඇත්ත කරගත් ආත්මීය දැනීම දෙයක් කරගත්ත තැනයි. අවිද්‍යාව දෙයක් නැති බවට සත්‍ය මිදීම අවිද්‍යා අශේෂ ශේෂ නිරෝධෝ කියන එක අවිද්‍යා ප්‍රහීණ වෙනවා කියන්නේ ඒකටයි.

**ආර්යන් වහන්සඃ සංඛාරා කියන්නේ අපි ශබ්ද, වර්ණ හදා ගත්ත දෙයක් නිරූපණයමයි.** සංඛාරා කියන්නේම දෙයක් කර ගැනීමයි. අවිද්‍යාව. එකම තේරුම. **ඒකමයි විඤ්ඤාණය**. ඒකත් එකම තේරුම. අනිදස්සන විඤ්ඤාණය කියල කියන්නේ ඇත්තක් නොකර ගන්න මිදීම දැනෙන ස්වභාවය පතිත වුණේ නෑ කියන තමන්ටම **සාංදිට්ටික ප්‍රත්‍යක්ෂයක්** එනවා. ඒක දැනෙන්නේ සිහියට. ඒ සිහියයි දියුණු වෙන්නේ. අන්න ඒ **යෝනිසෝමනසිකාරය** ඒ සිහිය තමයි **සම්මා සතිය**. නාම රූප වලින් මිදුණ සතිය එහෙම වුණොත් තමයි සම්මා සමාධි. එහෙම වුණොත් තමයි මේ ගමන තියෙන්නේ.

අන්න සම්මා දිට්ඨි සත්‍ය දකිනවා කිව්වෙ දර්ශන සමාපත්තිය කිව්වේ ඕකටයි. සම්මා දිට්ඨිය නැතුව සම්මා වාචා, සම්මා සංකප්ප, සම්මා ආජීව සියල්ලම සම්මා බවට පත්වෙනවා. නාම, රූප නැති සිතුවිලි වලින් මිදුණු සත්‍ය දකින තැන සම්මා දිට්ඨිය තුළයි තියෙන්නෙ. එතකන් කිසි කෙනෙකුට ආර්ය අෂ්ඨාංගික මාර්ගය හමුවෙන්නේ නෑ. නැති කෙනාටයි සම්මා සංකප්ප, සම්මා ආජීව සියල්ලම ප්‍රත්‍යවේක්ෂාවක්මයි.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස. ඒක හොඳටම පැහැදිලි වුණා.

**ආර්යන් වහන්සඃ** මෙහෙණින් වහන්සේ දැන් ඉන්න මට්ටම තුළ පොත් වලින් ගන්න දේවල් ගොඩක් නෑ. මෙනෙහි කරන එකයි තියෙන්නේ.

අහන ධර්මය පවා ප්‍රමාණවත්. නිවන් දැකීමට සියල්ලම හම්බ වෙලා තියනවා.

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි. සාදු! සාදු! සාදු! ස්වාමීන් වහන්ස. තව පොඩි තැනක් තියෙනවා ක්‍රියා සිත් කියන තැන.

**ආර්යන් වහන්සෑ** ඕවත් අමුතුම දේවල් නෙමේ මෙහෙණින් වහන්ස. මේ අවබෝධයට පත්වෙන කොට ප්‍රභාස්වර හිතයි, කිසිම සංඛාරායක් පනවන්න බෑ. හැම දෙයක්ම ක්‍රියාවලියක් විතරයි.

**මෙහෙණින් වහන්සෑ** මම දැන් මිදුල අතුගානවා. ඒ අතු ගෑවට ඒ මොහොතට අතුගාන සිතිවිලි නෙමේ වෙනත් සිතුවිලි එනවා. ඒ සිතුවිලි දැක දැක

**ආර්යන් වහන්සෑ** නෑ. නෑ. මෙහෙණින් වහන්ස. අපිට ප්‍රශ්නේ පැහැදිලියි. අතුගාන කොට සිතුවිලි එනවා කියන කොට තමන්ට විපස්සනාවයි තියෙන්නේ. විදර්ශනාව නෙමෙයි. ඔය දෙකේ වෙනස දකින්න ඕන. දැන් සිතට සිහියක් පවතිනවා. ඒ සිහිය තමන්ට සිතුවිල්ලක් ආපු බවට සිහියකි. ඒ සිතුවිල්ල විදර්ශනාවට ලක්වෙලා තමන් සත්‍ය දකින එක තමන්ගේ මාර්ගය තුළ සිද්ධ වෙන්න ඕන දෙයක්. ඒක සිද්ධ වෙනවා නම් ඒකටත් සිහියයි.

**මෙහෙණින් වහන්සෑ** සිද්ධ වෙනවා ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** සිද්ධ වෙන්නේ නැතිනම් යථාභූත ඥාණයෙන් තව ධර්මය මෙනෙහි කරන්න. එතන එතන දකින එකත්, ධර්මය සිහිකරනවා කියන්නේ 2ක්. බොජ්ජංග ධර්ම වැඩෙන කොට, ධම්ම විජය සහ බොජ්ජංග කිව්වේ අන්න ඒ නිසයි.

**ආර්යන් වහන්සෑ** පුංචි දරුවා මේ ලෝකේ ඉපදුණාට පස්සේ පුංචි දරුවට මේ ක්‍රියාවලිය තියෙනවා. දරුවා දන්නේ නෑ බිත්තියක් ද, මේසයක්ද, ඇඳක්ද කියලා. ඒක අදාළත් නෑ. පුංචි දරුවා ඒ වුණාට කන්නේ නැද්ද? බොන්නේ නැද්ද? දරුවා දඟලන්නේ නැද්ද? ඉතිං ක්‍රියාවලිය ඒකනේ. දැන් වැහිලා තියෙන්නේ මොනවායින්ද? සිතුවිලි වලින්. දැන් අපි හැම තිස්සේම මම කරනවා කියලා සිතුවිලි වලට ගැට ගහනවා. ඊට පස්සේ මම අතුගානවාකියලා සිතුවිලි වලින් දකින්න යනවා. දැන් මම අතුගානවද? මේක ක්‍රියාවලියක්.

මෙතනදී මනෝ විඤ්ඤාණයෙන් සිතුවිලි ඇති වෙලා නැති වෙන එක සාමාන්‍යයයි. එතකොට මෙය දකින බවට සොබා දහමේ සිද්ධ වෙනවා. **අන්ධ වෙලා නෑ නේ. පේනවා. බිහිරි වෙලා නෑනේ. ඇහෙනවා. අර ආයතන ගැන මනා අවබෝධයක් තියනවා. ඒ අවබෝධය තුළ තමයි "සංඛිතේ නිබ්බිදාය" කිව්වේ ඒකමයි.** ඒවත් එක්ක **"සබ්බේ ධම්මා නාලං අභිනිවේසා"** කිව්වේ. ඒවට රිංගන්නේ නෑ.

**මෙහෙණින් වහන්සඃ** ඒවත් එක්ක කිසිම සම්බන්ධතාවක් වෙලා නෑ. ක්‍රියාවලිය සිද්ධ වෙනවා.

**ආර්යන් වහන්සඃ** හැමදේම සිද්ධ වෙනවා. ශබ්දයක් ඇහෙනවා, පේනවා. හිනාත් වෙනවා. කතා කරනවා. හැමදේම හොඳට වෙනවා. ඒ එකකටවත් රිංගලා නෑ. අන්න ආත්මීය ස්වභාවය කම්පනය වන්නේ නෑ කිව්වේ ඒකටයි. **"ආකෝපාත චේතො විමුක්තිය"** කිව්වේ ඒකටයි. මිදුණු ස්වභාවයකට අවධි වෙනවා. ඒකයි **මොහොතට අවධිය කිව්වේ. අන්න ක්‍රියා සිතයි ප්‍රභාස්වර සිතයි ක්‍රියාවලියයි** මතු වෙනවා මොහොතට අවධිය කියන තැන.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ පුදුමාකාර ධර්මයක් ඉස්මතු වෙනවා. මෙච්චර කල් මමෙයි කියල හිතං හිටපු, කුණු ගොඩ මොකක්ද කියලා හිතෙනවා. අර මලක් පිපුණ වගේ ප්‍රභාස්වර ස්වභාවයක් දැනෙනවා. මුළු ලෝකේටම විවෘත වෙනවා. මුළු සිතම විසිරිලා යනවා. දෙයක් නෑ හිරවෙන්න. කයෙහිවත් නෑ හිරවෙලා. කොහේද මම ඉන්නේ? මම කොහේවත් ඉන්නවද නෑ. අන්න මහා අමරණීයයි. මහා අනුත්තර වූ අන්න බුද්ධත්වයට එනවා. බුද්ධ ස්වභාවය කියන්නේ ඕකටයි.**

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සඃ** අනුත්තරයි, අන්න උත්තරීතර ස්වභාවය එයයි. ඒකේ කිසිම තැනක් රහ නෑ. අරහත්වය එයයි. කෙනෙක් පුද්ගලයෙක් නෙවේ මේ. බුද්ධ කියලා එහෙම පුද්ගලයෙක් නෙමේ. ස්වභාවයටයි බුද්ධ කිව්වේ. ස්වභාවය කියලා කෙනෙක් නිරූපණයක් කරන්න බෑ. අන්න ඒ නිසයි සොබා දහමට දියවෙලා ගියාය කියලා ඉස්සරහට ඇවිත් දඟලන්නේ නැත්තේ. ඒ ස්වභාවයටයි පත්වෙන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. සාදු! සාදු! සාදු!

**ආර්යන් වහන්සඃ** දැන් නම් ඉන්නවා නළුවෝ වගේ මම රහත් කියලා කියන ඒවත් අහලා. මම තමයි බුද්ධ කියලා අමුතු ආරෝපණ ගත්ත අයත් ඉන්නවා. පව් එයාලා ඒ තරම් පෘථග්ජනයෝ, දෙව්දත්ලා වගේ රූපෙන් බුදුන් හොයන්නේ.

**ආර්යන් වහන්සඃ බාහිර දෙයක් නැති බව දකිනවා. අන්න එතනයි බෞද්ධ භව නිරෝධය දකිනවා. ඉද භික්ඛු මේ භික්ඛු මේ ශාසයේ භික්ෂුවක් වෙනවා.**

**දෙව්දත් දැක්කේ බාහිරින් බුදුන්. දෙව්දත් හිතුවේ බුදුන් මරලා දෙව්දත් බුදු වෙන්න. දෙව්දත් දැක්කේ නෑ හිත තුළ කෙලෙස් නැසුවට පස්සේ ඒ ස්වභාවයට පත්වෙන්නේ කියලා.**

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** නෑ. නෑ. ආමිසයට ගැට ගැහිලා තියෙන්නේ. ඔය ආමිසයට ගැට ගහනවා නේද? භික්ෂූන් වහන්සේලා මේ ගිහියන්ව. ඒක මහා අපරාධයක්. ඊට පස්සේ ඒකෙන් ගැලවෙන්න බැරි වෙනවා. ඔක්කෝම දෘෂ්ටි ගතවෙලා අපාගත වෙනවා. හිතාගෙන හිටියට වැඩක් නෑ.

**මෙහෙණින් වහන්සඃ** ඒක තමයි ස්වාමීන් වහන්ස වෙලා තියෙන්නේ.

**ආර්යන් වහන්සඃ** ඒකයි කිව්වේ අශෝක අධිරාජයා අසූ හාරදාහක් වෙහෙර විහාර හැදුවත් මේ ධර්මය අවබෝධ නොවුණ නම් දුගතියට වැටෙනවා. මල්ලිකා දේවිය අසිරිසි මහා දානය දුන්නත් දුගතියට වැටුණේ. බාහිර ඇත්ත කරගෙන නේ දාන දෙන්නේ. දුගතියටයි වැටෙන්නේ. සතර අපාය උරුමයි. හේතුව ලෝකය ඇත්ත කරගෙන බුද්ධ ධර්මයක් නෑ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ස්වාමීන් වහන්ස. මේ නිර්මල දහම තියෙන්නෙ.

**ආර්යන් වහන්සඃ** ඇත්තටම ධර්මය ගැන පුදුමාකාර කතාවක් තියෙන්නේ. ධර්මය ගැන නිර්වචන නෑ. හරි ගාම්භීරයි. ධම්මං විනා නත්ථි පිතාච මාතා කියන කොට තේරෙනවා.

මේ ලෝකේ උතුම්ම ඇත්තටම අපි ගෞරව දක්වන්නේ මව්පියන්ට. එහෙනම් බුදුන් වහන්සේ කියනවා මේ ධර්මය දැක්කොත් මවෙක්ද, පියෙක්ද නැත මහණෙනි. පුදුමයි. නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ කියන තැන. නිසසත්තෝ නිස්ජීවෝ ශූනයෝ කියන කොට කොහෙන්ද මවෙක් පියෙක් හමුවෙයිද? සොබා දහම බවට දියවෙනවා. එහෙම වුණොත් පමණයි සුගති පරායන වෙන්නේ. අන්න සෝතාපන්න භූමිය.

**මෙහෙණින් වහන්ස** : එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සඃ** ඔය ප්‍රශ්නේ තමයි කෙටියෙන් බුදුන් වහන්සේ හැම සූත්‍රයකම අහලා තියෙන්නේ **"රූපං නිච්චතෝ අනිච්චතො" කියලා "අනිච්චං භන්තේ"** කියන්නේ ලොකු කතාවක්. **ඉද භික්ඛවේ භික්ඛු මේ ශාසනයේ භික්ෂුවක් වෙන්නේ එතැනින්.** ඒ කියන්නේ බාහිර දෙයක් තියනවා කියලා ගත්තොත් අන්න බෞද්ධ වෙන්නේ නෑ. **භව නිරෝධයක් දකින්නේ නෑ. බාහිර දෙයක් නෑ කියලා දකින එකයි රූපං නිච්චතෝ අනිච්චතෝ, අනිච්චං භන්තේ කියලා කියන්නේ බාහිර දෙයක් නැති බව දකිනවා. අන්න බෞද්ධයෙක් වෙනවා. අන්න එතනයි බෞද්ධ.**

ඉද භික්ඛවේ භික්ඛු මේ ශාසනයේ භික්ෂුවක් වෙන්නේ ඔතනින්. ගොඩක් අය කියවනවා මන්ත්‍රයක් වගේ. අවබෝධයට පත්වෙන්නේ නෑ. ඒ මහා අග්නි මාන්නය වැඩිවෙලා තමන් ඉස්මතු කරගන්න. **පුද්ගලයෙක් හදාගෙන අපි කියපු දේවලුත් අපි දන්නවා සමහර අය කියන්න යනවා තමන් අවබෝධ කරා. අපි දන්න දෙයක් නෑ වගේ. ඇත්තටම මේ බුද්ධෝත්පාද නාලිකාවේ ඒ හෙළිකරපු ඒ ප්‍රත්‍යක්ෂතාව තුළ පළමු වතාවට සමහර සූත්‍ර වල පැහැදිලි කරපු ඒවා තමන්ගේ කියලා කියාගෙන ගියාට, ලොකුකම ඉස්මතු කිරීම පමණයි. ඒවා කවුරුත් දැනගන්නවා ලැජ්ජාවට පත්වෙනවා කවුරුහරි කවදාහරි දැනගන්න ලැබෙනවනේ. සත්‍ය සත්‍යයමයි.**

**ඒක බුද්ධෝත්පාද නාලිකාවේ ලෝකෙට හෙළි කරපු පරම සත්‍යයි. ඒ බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන පරම සත්‍ය, ප්‍රත්‍යක්ෂ ඤාණයෙන් ලෝකෙට නැවත ඒ හෙළි කරන මේ බුද්ධෝත්පාද නාලිකාවේ අපි විසින්ම අප උදාර දක්වමි. ඒ සූත්‍ර වල මෙය නොවේ. මෙයයි කියන එක ඒ බුද්ධෝත්පාද නාලිකාවට ගෞරවය විය යුතුයි. ඒ කෙනෙකුට පුද්ගලයෙකුට අවශ්‍ය නෑ. අපි කියන්නේ ඒ සොබා දහමමයි. කෙනෙක්**

**පුද්ගලයෙක් දකින්න යන්න එපා. ඔබ උරචක්‍රමාලයෙන් කෑල්ලක් ගෙන එය හදාගෙන මාන්නයක් හදාගෙන ඒ මම තමයි කියලා කිව්වොත් ඔබ දෙව්දත්ගේ ගොඩටයි වැටෙන්නේ.**

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සෑ** බුදුන් මරා බුදු වෙන්න ගියා වගේ අර ගුත්තිල මූසිල කතාව, අමුතු කතාවක් හැදෙනවා. සීමා කරන්න යන්න හොඳ නෑ. ඇත්තටම තමන්ට අවබෝධ උණු දේ අවබෝධයක් ඤාණය තුළ ප්‍රකාශ කරන එක හොඳයි. අපි උනත් ඇත්තටම බුදුන් වහන්සේ පස්වග තවුසෝ ගාවට ගියෙ නැත්තේ නෑ නේ. බුදුන් වහන්සේ ආලාම කාලාම උද්දකරාමපුත්ත ඒ ධ්‍යාන ඒවා බැලුවේ නැත්තේ නෑනෙ. ඒවා බැලුවනේ. ඒකනේ අදටත් තාම ඒවා කියවන්නේ. හැබැයි බුදුන් වහන්සේ **"පටිච්ච්සමුප්පාදය"** මෙනෙහි කරනව නේ. අන්න ඒ වගේ.

**ආර්යන් වහන්සෑ** බුද්ධෝත්පාද නාලිකාව පරිශීලනය කරන එක ඉතාම භාග්‍යයක්. ඒකෙන් තමන් යමක් අවබෝධ කරගන්න කොටම ඒක ප්‍රත්‍යක්ෂතාවට පත්වෙන කොට තමන් සත්‍යබෝධය කළා වෙනවා. එතකොට තමන්ට කියන්න පුළුවන්කමක් තියෙනවා. ඒ බුද්ධ දර්ශනය අපි අවබෝධ කළා. බුද්ධෝත්පාද නාලිකාව අපිට රුකුළක් වුණා කියන්න පුළුවන්. එහෙම නැත්නම් මේ මම තමයි මේක කියන්නේ කියලා මිනිසුන්ව මිථ්‍යාදෘෂ්ටියේ දාන්න එපා.

**ආර්යන් වහන්සෑ** අපි හැමෝම අඳුන ගන්න ඕනේ මෙතන ධර්මතාවක් විතරයි කියලා. මේකේ තුළ සත්ව, පුද්ගල කතා නෑ. එතකොට ඔය එකක්වත් තේරුමක් නෑ. සත්‍ය ඉස්මතු වෙනකොට සැබෑ මනුෂ්‍යයා තුළ සොබා දහම වගේමයි. සැනසිල්ලක්, ගින්නක් නෑනේ. සුන්දරයි. අපිට මොකටද තවත් ආභරණ, මල් මාලා, පට්ටම් අපිට එපා ඔය මොනවත්.

**මෙහෙණින් වහන්සෑ** තෙරුවන් සරණයි

**ආර්යන් වහන්සෑ** තෙරුවන් සරණයි

මෙම දේශනය ඊළඟ දේශනාව හා සම්බන්ධ වේ. (මට මම නැතිවන හැටි 4)

4

# මට මම නැති වන හැටි

**මෙහෙණින් වහන්සෑ** තෙරුවන් සරණයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** තෙරුවන් සරණයි

**මෙහෙණින් වහන්සෑ** ඔබවහන්සේ කිහිප වතාවක්ම ගැඹුරම නිවන් මඟ පහදා දුන්නනේ. දැන් ඉතිං නිතරම ප්‍රායෝගිකව කරනවා. හැම දෙයක්ම හිත පවත්වන කොට හිතේ මායාව දකිනවා. ධර්ම කරුණු මතින් ධර්මතාවය අවබෝධ වෙනවා. එතකොට මේක ස්වාභාවික සංසිද්ධියක් කියලා තමයි හැම වෙලාවේම හිතෙන්නේ. දැනට තියෙන්නේ ආර්යන් වහන්ස ලොකු දුකකුත් නැති සතුටකුත් නැති හිත කරන්න ඕන කියලා නැතිව දහම දැකගෙන යන ස්වභාවයක්. ආර්යන් වහන්ස දැන් තියෙන ප්‍රශ්නෙ භාවනාවක් කරන්න ඕනද කියලා ඔබවහන්සේගෙන් දැනගන්න.

**ආර්යන් වහන්සෑ** දැන් ඔය කතා කරපු වචන ටිකේ තියෙනවා හිරවීමක් තියෙනවා.

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** සොබා දහම කියන්නේ මොනවද?

**මෙහෙණින් වහන්සෑ** ස්වාභාවික සංසිද්ධියක් කියලා කිව්වේ ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** ස්වාභාවික සංසිද්ධියක් කියලා කිව්වම, එතනත් දෙයක් වගේ දැනෙන්නේ නැද්ද? දැන් මෙතන දෙයක් කියලා දැනෙනවා නම්, එතන තියෙන්නේ ශබ්ද, වර්ණ නෙමෙයි නේ. එතන තියෙන්නේ එතකොට අර දැනීමක් නේ. දැනීමක් නම් එතන ආත්මයක් නේ. නෑ. නෑ. මෙහෙම දෙයක් හිතලා මොනවාහරි කියන්න ගියොත් එතන සිතුවිල්ලක්

වෙනවනේ. නමුත් ධර්මය කියන්නේ එහෙම දෙයක් නෙමේනේ. ධර්මය කියන්නේ දෙයක් නැති බවනේ. ඒක හසුවන්නේ සිහියට නේ. නේද? ඥාණයටත් හසුවන්නේ.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** එතකොට ඒක මේ සිතුවිල්ලක් කරගන්න බෑ නේ. අපි මොකක් හරි හිතුවොත් ඒක සිතුවිල්ලක් නේ. දැනෙන දැනීම සිතුවිල්ලක් කරගන්න හොඳ නෑ. මෙහෙණින් වහන්සේ කියන්න උත්සාහ කරන දේ කිව්වොත්, අපි දැන් කිව්වොත් මම නිවන් දැක්කා කිව්වොත්, දැන් මම රහත් කියලා කිව්වොත්. එතැනින් එහාට කතා කරන්න දෙයක් තියෙනවද? ඇත්තටම ඔය රහත් කියන අය රහත්ද? ඇයි ඒ අය රහත් නැත්තේ. ඒ අය රහත් නැත්තේ පිනවනවා පේනවා. අපිට පේනවා ආත්මයක් ඒ අය ඇසුරු කරන බවට. අපිට තේරෙනවා ඒ අය හම්බු කරනවා. ඒ අය ආස හිතෙන දේවල් පරිහරණය කරනවා. අපිට තේරෙනවා ඒ අය අසා හිතෙන කෑම හදාගෙන කනවා. අපිට පේනවා ඒ අය "මනදොල", ඇස, කන, නාසය, දිව ආයතන පිනවනවා. අපිට පේනවා දැන් හොඳට තලුමර මර විඳිනවා. හොඳටම කම්සැප විඳිනවා.

හොඳටම කම්සැප විඳින අස්‍රුතවත් පෘථග්ජනයෙක් කියනවා මම රහත් කියලා. එයා හිතනවා එයා රහත් කියලා. එයා හිතනකන් පුළුවන්ද මේ ධර්මය ගන්න. ඇයි එතන කෙනෙක් ඉන්නවා. එයා හිතනවා දැන් මම නෑ කියලා. හිතනවා මම නැතිවුණා කියලා. දැන් එයාට කොහොමද මේ ධර්මය දෙන්නේ. එයා හිතනවා මම රහත් වෙලා මම දැන් නෑ මම කියන එක ඕගොල්ලො අහන්න. මගෙන් අහන්න එපා වෙන ක්‍රමයක්වත් ඒවා වැඩක් නෑ. රහත් වුණ ක්‍රම අහන්නත් එපා. ඒවා වැඩක් නෑ. ඕගොල්ලෝ පිළිගන්නව නම් පිළිගන්න කියලා. අපිට වැඩක් තියෙනවද ඒ රහත්කම.

බුදුන් වහන්සේ කියනවා මම බුද්ධ. මගෙන් අහන්න එපා බුදුවෙන ඒවා ගැන කොහොමද කියලා. මම කියන්න යන්නෑ. ඊත් මම බුද්ධ කියලා. එතකොට අපිට වැඩක් තියනවද ඒ බුද්ධගෙන්. තේරෙනවද මේ කියන කතාව. **මේක ප්‍රත්‍යක්ෂ ධර්මයක්.** කියන්නේ ඔය නිසයි. මේක විශ්වාසයක්වත් ඇදහිල්ලක්වත් නෙමේ. අපිට වැඩක් නෑ කවුරුවත් මම රහත් කිව්වට. එයා රහත් නේ. ඔයා යන්න ඔයා රහත් ඉතිං එච්චරයි. ඇයි ඒ එයා ඉන්නවනේ. රහත් කිව්වට. එයා ඉන්නවා හොඳට සැප විඳ

විඳ. එයා හිතනවා රහත් වුණාහම රත්‍රං පුටුවක වාඩි වෙන්න ඕන කියලා. එතකොට එයා රත්‍රං පුටුවකුත් හදවගන්නවනේ නේද? පාට හරි ගාලා හදා ගන්නවා. මොකද **මනදොළ** පිනවන්න ඕන නේ. එයාගේ මනදොල එයා පිනව ගන්නවා. ඊට පස්සේ එයා කියනවා මම තමයි දැන් ලොකු කියලා. ඊට පස්සෙ කියනවා ඔයාලා ඔක්කොම පහත් කියලා. මේක මහා විකෘතියක්. දැන් ඕක අපිට වැඩක් තියනවාද? එයාගේ රහත්කම එයාට හොඳයි කියලා. අපිට මොකටද? ඇයි ඒ? ඒකෙන් අපිට වැඩක් නෑ.

අපිට තියෙන **රාග, ද්වේෂ, මෝහ** නැති කර ගන්න මාර්ගයට යනකොට අපිට තව කෙනෙක්ගේ ඒවා වැඩක් නෑ. ලොකුකම් වැඩක් නෑ. අපිට මාර්ගය විතරයි වැදගත් වෙන්නේ. එතකොට ඒ මාර්ගය තුළ කටයුතු කරන කොට අපිට ඵල වලින් පලක් නෑ. එහෙම වුණොත් අපිටත් අර ලෙඩේ හැදෙනවා. දැන් ලෙඩක් හදා ගන්නද ඕන රහත් කියලා. මොකක් හරි ඵලයකට යන්නද ඕන. එහෙම නැත්නම් තමන් නැතිවෙනකම් තමන් සිහිය පවත්වන්නද ඕන. තමන් කියලා කෙනෙක් නැති බවට අවබෝධය කරගැනීම තුළිනුයි තමන් නැතිවෙන්නේ.

මෙහෙනින් වහන්සේගෙන් ඇහුව්වොත් තමන් කොතනද ඉන්නේ කියලා, දැන් රහත් වෙන්න කෙනෙක් ඉන්නවද? දැන් අපි බැලුවොත් එහෙම අපි හොඳටම දන්නවනේ කේවට්ට පුත්‍ර සාතිය භික්ෂුවට මිථ්‍යා දෘෂ්ටියක් ඇතිවෙනවා රහතන් වහන්සේලා මරණින් මත්තේ ඉපදෙන්නේ නෑ කියලා. රහතන් වහන්සේ රහත් කියන්නේම කෙනෙක් නෑ කියල. මරණින් මත්තේ ඉපදෙන්නේ නෑ කියන්නේම දැන් කෙනෙක් නෑ කියල නේ. එහෙනම් අපි මොකද්ද කරන්න ඕන. දැනුත් කෙනෙක් නෑ කියලා දකින්න ඕන. එහෙනම් අපිව දියවෙන තැන නේද වැදගත් වෙන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි.

**ආර්යන් වහන්සඃ** අපිව දියවෙන තැනට අපි අවබෝධ කරන්න ඕන නේද? මේ සත්‍ය කුමක්ද කියලා. ඒ සත්‍ය අවබෝධය කියන්නේ කෙනෙක් පුද්ගලයෙක් නැති බව නේද? එතකොට අවබෝධ වෙන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙනම් අවිද්‍යා ශේෂ විරාග නිරෝධෝ කියන්නේ අවිද්‍යාව කියන්නේ මේ සත්‍ය නොදන්නකමට. එහෙමනම් ඒ සත්‍ය දැනගත්තොත් මොනාද වෙන්නේ?

**ආර්යන් වහන්සෑ** අපිට සත්‍ය දැනෙනවා. දැනෙන කොට තමන්ට තමන් නියෝජනය වෙනවද කියලා දැනෙනවා. තමන්ව හැමතැනම ඉස්මතු වෙනවා නම් ඒ ඉස්මතු වෙන්නේ සත්‍ය දකින කෙනා දන්නවා ඒ ආත්මයමයි කියලා. ආසාවක් තියනවා නම් සිතයි කියලා කියනවා නම් එතකොට එතන කෙනෙක් ඉන්නවා. එහෙනම් අපි හැමතැනම අපි දිහා බලන්න ඕන. අපි එළියේ නෙමෙයි කණ්ණාඩිය ගහන්න ඕන. තමන්ට. අපි කිව්වේ තමන්ටම Focus කරනවා කියලා එතකොට අපි අපිව හොයන්න ඕන හැමතැනම තමන් ඉන්නවද කියලා බලන්න ඕන. අපි ඉන්නව නම් එතන ධර්මය බලන්න ඕන. කොහොමද අපි ඉන්නේ කියලා. එහෙමනම් ධර්මය සත්‍ය නම් දෙයක් නැතිනම් එහෙනම් අපිට දෙයක් හම්බ වෙන්න බෑ. **"දෙයක් තිබ්බොත් ඒ තමයි මම."**

දැන් පොත තියෙනව නම් පොතෙන් තොර මමෙක් නෑ කියලා කිව්වනේ. එතකොට ඒ ධර්මය ගොඩාක් පැහැදිලි කරපුවා අහන්න ඇති නේද? ගොඩාක් ගැඹුරින් පැහැදිලි කරා.

**මෙහෙණින් වහන්සෑ** ආර්යන් වහන්ස ඒ බාහිර දෙයක් නෑ කියලනේ හිතන්නේ. තේරෙන්නේ නෑ ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෑ** බාහිර දෙයක් නෑ කිව්වහම මෙතන කෙනෙක් ඉන්නවා. එහෙමද? දැන් මම දකිනවා බාහිර කෙනෙක් නෑ කියල එහෙමද?

**මෙහෙණින් වහන්සෑ** නෑ. මමත් නෑ කියලා හිතෙනවා.

**ආර්යන් වහන්සෑ** දැන් මෙතන වැදගත්ම කාරණාව තමයි මේක දෙයක් හැදෙන්නේ කොහොමද? අපි දැන් ඇස ගමු. ආයතන 6යිනේ තියෙන්නේ. මේ ආයතන 6 න් නේ මේ හැම දෙයක්ම එන්නේ. දෙයක් තියනවද? නැද්ද? ඔක්කෝම විඤ්ඤාණයට නේ.

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි.

**ආර්යන් වහන්සෑ එහෙනම් අපි විඤ්ඤාණයනේ සුද්ද කර ගන්න ඕනේ. බලන්න ඕකෙන් කොහොමද වෙන්නේ කියලා. ඇසට එන්නේ මොකක්ද ආලෝකයක්,** කනට ශබ්දයක්. නේ මේ ද්වාර වලට ස්පාක් වෙන්නේ මොනවද? ප්‍රසාද වෙන්නේ, ඇසට ආලෝක හැඩතල, කනට ශබ්දය, නාසයට ගන්ධය, දිවට රස, කයට උණුසුම, සීතල. දැන් මේවා

නේද එකතු වෙලා තියෙන්නේ. එහෙනම් අපි පොත කිව්වොත් පොත කියන්නේ ශබ්දයක්. ඒ වගේම හැඩතලයක්.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** එතකොට ආලෝකයක්, හැඩතලයක්, ශබ්දයක් නේද? එකට එකතු වෙන එක සම්පටිච්ඡන්න වෙන එක නේද? දැන් පොත කියන්නේ මොකක්ද? අපිට හැඩතලයක් එනවා. හැඩතලයකට නමක් තියෙනවා. කොහෙන්ද ඒක ආවේ. අන්න එතන තමයි දෝෂේ තියෙන්නේ.

**මෙහෙණින් වහන්සේ:** "ඒක අතීතේ."

**ආර්යන් වහන්සේ:** අන්න එතන තමයි දෝෂේ තියෙන්නේ. අතීතයක් තියෙනව නම් මම කොහොමත් ඉන්නවා. ඇයි මට අතීතයක් තියෙනවා. තේරෙනවද? දැන් අතීතයක් තියන මම ඉන්නවා. ඕකත් දෙයක් නේ. අපි මේ හිතන ධර්මයම එන්නේ අනික් පැත්තට. **"භ්‍රමරංගයක්"** මගේ ඔළුවටම. අපි එක දෙයක් නැති කර ගන්න තව ගොඩක් දේවල් ඇති කර ගන්නවා. දැන් මම අතීතයම ඇත්ත කර ගන්න දැන් බලන කොට මේක එන්නේ අතීතයෙන් කිව්වහම එහෙම දෙයකුත් නෑ. **"අවුත්තා සම්භූතා උත්තානම් භවිස්සති"** කිව්වහම පෙර නොතිබීම මේ ස්පාක් එක ඇති වෙනවා. ඉතුරු නැතිවම නිරුද්ධ වෙනවා. එක තැනක හරි පොඩි හිලක් තිබ්බොත් මොකද වෙන්නේ. පනිට්ටුවේ වතුර ඔක්කෝම යනවා නේ.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** මහ මුහුදේ නැවක් ගිලෙන්න යනවා. දැන් නැවේ තියන වතුර අස් කරනවා. කොච්චර වතුර අස් කරන්න ගියත් හිල් තියනකම් වතුර එනවා. නැව ගිලෙන එක නවත්වන්න බැහැ. ඒ කිව්වේ මොකක්ද? අපි මේ අවිද්‍යාව කියලා අපි ගාව නොදන්න පොඩි දෙයක් හරි තිබ්බොත්, එක තැනක හරි දෝෂයක් තිබ්බොත් ඒකම තමයි ආත්මේට හේතුවෙන්නේ. ඒකම තමයි මම ඉන්න බවට දැනෙන දැනීම. අතීතයක් කියලා එකක් නැහැ. තේරෙනවද මේ කියන කතාව. හැබැයි මේ ධර්මය පැහැදිලි කරන කොට මහාභූත විදිහට එක පඩියන් පෙන්නනවා. අතීතේ ඉඳලා අතීත සංඥාවයි මේ තියෙන්නේ කියලා තව පඩියක් පෙන්නනවා. ඊළඟ උඩ පඩියට නගින කොට ඔය එකක්වත් තියෙන්න බැහැ. අපි

ඒ පඩි ඔක්කෝම තියාගෙන උඩ පඩියට නඟින්නේ කොහොමද? එක කකුලක් යට වෙන්න ඕනේ. එහෙනම් නැගලා නෑ තාම.

**ආර්යන් වහන්සේ:** අපි එක තැන තාම බලන කොට. ආයි උඩට කකුල තියනවා. ආයි යටට තියලයි අනික් කකුල උඩට ගන්නේ. එහෙම වුණාම කවදාවත් උඩට නඟින්න බෑ. ඇයි ඒ? යට පඩියෙන් කකුල එන්නේ නෑ. බයේ ඒක යටින් තියාගෙනම ඉන්නවා. මම නැතිවෙයි කියන බය වගේ. ඒ කියන්නේ අතීතයේ කියලා. එහෙම එකක් මේ ධර්මය අවබෝධ කර ගන්න කොට කියනවා **"පෙර සංඥා", "නව සංඥා" කියලා. හැබැයි මේක මේ මොහොතේම ස්පාක් වෙන්නේ කියලා. අපි කියනව නේ ආරෝපණයක් ඇතිවෙන්නේ කියලා. චුම්බක ආරෝපණය. විද්‍යුත් ආරෝපණය, ආත්මීය ආරෝපණය, චිත්තාරෝපණය ට්‍රිලියන් ගාණක් මේ තියෙන අපි කියනව නේ මේස, පුටු, ඇඳන්, ඉර, හඳ, ගහකොළ ඔය කියන හැම දෙයක්ම ශබ්දයක් නම් වර්ණයක් එකතු වුණු ආරෝපණයක් තමයි "ආත්මීය ආරෝපණය."** දැන් අපි Current එකක් නම් කරන්ට් එක වැදුණොත් එහෙම 230w ඒ තියෙන කරන්ට් එක වදිනවා. ඒ ආරෝපණය තමයි "අස්මීමිමාණය" ඒ කියන්නේ නන්දිරාගය.

**ආර්යන් වහන්සේ:** ඒ කියන්නේ "අභිනන්දති, අභිවාදති, අජ්ජොසාති තිට්ටති, යා රූපේ නන්දි, තදු උපාදනං භවො." (භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං ශෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස උපායාසා සම්භවන්ති.)

අන්න උපාදාන ගොඩ කිව්වේ. අල්ල ගත්ත කිව්වේ. ඒක නිසා තියනවා කිව්වේ. නැතිවෙන්නේ නෑ කිව්වේ.

ඒ කියන්නේ යම් මොහොතක් අපි ආත්මීය දැනීම තුළ ඔය සේරම තියනවා කියලා ඉන්නවා. ඉරක් තියනවා හඳත් තියනවා. උඩ බලන කොට යට තියෙනවා කියලා අපි දන්නවා. අපි බිත්තිය දකින කොට අනික් ඔක්කොම තියනවා. අපිට මේසේ දකින කොට පුටු, ඇඳන්, මේස තියනවා. මේ එක සිතයි මේ එක මොහොතේ තියෙන්නේ. ට්‍රිලියන් ගාණම ඕකේ තියෙනවා කිව්වොත් තියනවා. ඒ සිත සත්‍ය දකිනවා කියන්නේ මෙතන ඒ හටගත්ත සිත සත්‍යයක් නොවන බව දකින එක මෙනෙහි කරන්නම ඕන.

**ආර්යන් වහන්සේ:** එතකොට තමයි අපිට දැනෙන්නේ අපි මේ ඇසුරු කරන මේ මොහොතේ දකින දේ පොත, මේසේ, පොත කියලා කියන්නේ නෑ නේ පොත. අපිනේ කියන්නේ. එතකොට මේ මොහොතේ අපි දකින කොට පොත නැතිවෙන්නේ නෑ නේ. අපි අන්ධ වෙන්නේ නෑ නේ. බිහිරි වෙන්නෙත් නෑ නේ. අපිට මේ ඇස, කන, දිව, නාසය, වර්ණ, ගන්ධ, රස ස්පාක් වෙවී තියෙන්නේ හැම මොහොතේම. ස්පාක් වෙන එක නවතින්නේ නෑ. මෙතැන අපේ අවබෝධයක් ඇති වෙනවා. අවබෝධයක් ඇති වුණාම අර කණ්ණාඩියේ සේරම පෙණුනට දෙයක් නැති බවට අපි අවබෝධයි. අර ස්පාක් වෙන එක නැතිවෙන්නේ නෑ.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි ආර්යන් වහන්සේ.

**ආර්යන් වහන්සේ:** අර අතීතයෙන් මේක ආවා එහෙම කියලා එහෙම දෙයක් නෙවේ. අපිට මේ අවබෝධය අතීතය කියලා එහෙම දෙයකුත් නෑ. මේ මොහොතේ වර්තමාන සිතක් තමයි අතීතය මතක් වුණත් අතීතයෙන් ආවා කියන කොටම අතීත සිත ඇතිවෙලා ඉවරයි. හැබැයි එකත් නම් වර්තමාන සිතක්. මෙතන ලොකු අවබෝධයක් ඇතිවෙන්න තියෙනවා. මේ "ක්ෂණය" කියන එකට. එතකොට මේ මොහොතේ මේ ස්පාක් එක අවබෝධ කරගන්න. අවබෝධ කරගත්තට පස්සේ අපි දන්නවා මෙතන මේ සිත මේ හටගත්ත ස්පාක් එක විතරයි. මේ සෙන්සර්ස් වල ස්පාක් වෙනවා. හුස්ම වැටෙනකම්ම ස්පාක් වෙනවා. හුස්ම නවතින කොට නැතිවෙනවා.

**ආර්යන් වහන්සේ:** අපි කියනවනේ කකුලේ ඇඟිල්ලක් කපනවා අසනීප වෙන කොට දියවැඩියාව හැදුණාම එහෙමනේ. ඊට පස්සේ කකුලක් කපනවා. කකුල් 2කම නැති වෙනවා නේ. ඊට පස්සේ අතක් කපනවා. ඊට පස්සේ අත් 2ම නැති වෙනවා. දැන් කාටද නැතිවෙන්නේ? මට දැන් මගේ කකුල නෑ. ඇඟිල්ලකුත් නැතිවුණා. මේ ශරීරයද මම කියන්නේ. එතකොට මේ කයද මම. මේ සිතුවිල්ලක් නේ. ඒකනේ මේ ඇඟිල්ලක් නෑ, කකුලක් නෑ, අත් 2 නෑ, මේ කය නෙමේනේ සිත නේ මැරෙන්නේ. ඒකනේ අපි කිව්වේ හිතයි නැතිවෙන්නේ කය නෙමෙයි. සිත නැති නිසයි කය වළලන්නේ කියලා. හැබැයි මේ සිත හැම මොහොතේම ස්පාක් වෙන එකයි සිත කියන්නේ.

**ආර්යන් වහන්සේ:** දැන් කෝ මම? මම නෑ. ඇයි මම කිව්වේ කාටද? හිතට. පොතත් ස්පාක් වෙනවා. අපි කියනවා පොත කියලා. පොත

කියන්නේ මනෝවිඤ්ඤාණයට. ආයතන විඤ්ඤාණයට දන්නේ නෑ ඇහැට වර්ණෙ විතරයි. කනට ශබ්දේ විතරයි. හැබැයි එතකොටම පොත එනවා.

**ආර්යන් වහන්සඃ** පොත ආවේ කොහොමද? ඒවා හොයන්නේ නැති වුණොත් ඒවා ලේසියෙන්ම එනවා තේරුණාද? මේ මොහොතේ පොත ස්පාක් වෙනවා. ඇයි මේ අපේ තියෙන ස්පාක් එකට **චිත්තාරෝපණය** තියනවානේ. අපේ මේ බඹරේ කැරකෙනව නේ. ස්පාක් වෙමිනේ තිබුණේ පොඩි කාලේ ඉඳන්

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි.

**ආර්යන් වහන්සඃ** එහෙනම් **බඹරේ නැවතිලා නෑ නේ.** එහෙනම් හුස්ම නවතින්න එපැයි. ඒ **බඹරේ කැරකෙනකම්ම මෙතන ආරෝපණයක්** තියෙනව නේ. වේගයෙන් කැරකෙනව නේ. **ගිනි වළල්ල** වගේ. ඒක සාමාන්‍ය විදිහට ස්පාක් වෙවී තියනවා. **මනෝ විඤ්ඤාණයෙන්** ඒ එනවා **සංඥා** ටික. ඒ **සංඥා නැති කරන්න** බෑ. එනවා. මෙතන අවබෝධය කිව්වේ ඒකයි. **කණ්ණාඩියේ මුකුත් නැති බවට අවබෝධයි. අන්න ඒ අවබෝධය. එයටයි කිව්වේ සංඛිතේ නිබ්බිදාය.** අන්න **අවබෝධඥාණය** කියන එක. බාහිර මුකුත් නැතිවෙලා නෙමේ. අන්ධ වෙලා නෑ. ඔක්කෝම පේනවා. හැබැයි අපිට අවබෝධයක් ඇතිවෙනවා. ඒ අවබෝධය තමයි මේ කතා කරන්නේ. දැන් මම කොහේද ඉන්නේ? මම කියන්නේ අර වර්ණ හැඩතල එතකොට ඒකම නේද?

දැන් මේ මොහොතේ සිතක් නේද තියෙන්නේ. සිත කියන්නේ එන අරමුණ නේ. ඒක ස්පාක් එකක් නේ. ඒ ස්පාක් එක විතරයිනේ තියෙන්නේ. ස්පාක් එකේ මම කොහේද ඉන්නේ? දැන් ආලෝක හැඩතලයක ස්පාක් වෙන කොට පොත කිව්වොත් ඒ පොත නේද මම කියන්නේ. පොතෙන් තොර මමෙක් නෑ කිව්ව නේ. පොත කියන එක තියනවා කියන එකම නේද ආත්මය කියන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි, එහෙමයි.

**ආර්යන් වහන්සඃ** දැන් පොතක් තියනවා කියලා අවබෝධයක් තියෙනවා නේද? එතකොට එය නෑ කියලා අවබෝධ වෙනකොට තමන්ගේ ආත්මය නේද නැතිවෙලා තියෙන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සඃ** අර කියනවා නේ සූර්යාගේ රශ්මිය වැඩිවෙලා පෘථිවියම අළුවෙලා යනවා කියලා. එතකොට අභ්‍යවකාශය විතරයි ඉතුරු වෙන්නේ. බුදුන් වහන්සේම දේශනා කරනවා නේ ගිතෙල් දැවුණු තැනක අළුත්, දැලිත් ඉතුරු නොවී අළු වෙලා යනවා කියලා. **"සප්ත සූරියගම"** සූත්‍රයේ එතකොට ඇයි බුදුන් වහන්සේ මේ උපමාව ගත්තේ. දැන් පෘථිවියම අළු වෙලා යනවා. එතකොට අභ්‍යවකාශය විතරයි. දැන් කෝ මම. මෙච්චර කල් හිටපු කෙනෙකුත් නෑ. මේ කතාවේ අවසානේදී මේ සිතුවිල්ල නේ මම කිව්වේ. ස්පාක් එකනේ. ස්පාක් වෙන්න දෙයකුත් නෑ.

**මෙහෙණින් වහන්සඃ** මේ නැති දෙයකට තමයි අපි කියලා අල්ලන් ඉන්නේ.

**ආර්යන් වහන්සඃ** ඒකයි **ඒතං මම. ඒක දකින මම. ඒසෝ හමස්මි මම මගේ ආත්මය දෙයක් තිබ්බොත් විතරයි තියෙන්නේ. ඒ මනෝවිඥ්ඥාණය තමයි මම කියලා තියෙන්නේ.** ඇත්තටම පොත මම කියන්නේ පොතමයි. මම කියන්නේ දෘෂ්ටියක්. පොත කියන්නෙත් දෘෂ්ටියක්. මේ ඒක තමයි කිව්වේ පොතෙන් තොර මමෙක් නෑ කියලා. එතකොට මම තමයි මේ ගහ. තමන්ගේ ඉස්සරහ තමන්ට බනිනව නම් කවුරුහරි එයා තමයි තමන්. දැන් මම කෝ? ස්පාක් වෙන එක. මොකද්ද තියෙන චිත්ත අරමුණ. ආන්න ඒක තමයි මම. එතනයි මම. දැන් ඒකේ වටිනාකම නැතිවුණොත් මොකද වෙන්නේ? අන්න ඒක දියවෙනවා. අන්න ආත්මය දියවෙනවා.

අන්න නිබ්බිදන්ති, විරාගන්ති, විරාගන්ති, නිරෝධන්ති, පටිනිස්සග්ගානු පස්සි. අන්න රාග, ද්වේශ, මෝහ ක්ෂය වෙනවා. හැබැයි අරක වටින්නේ කොච්චරද අන්න ඒ තරමටම මමත් ඉන්නවා. දැන් බලන්න තමන් හැම තිස්සේම වටපිට බලන කොට, අපි හිතමු දැන් කෑමක් කනවා, රස පටිසංවේදී, රස දිවට දැනෙනව නේ. දැන් මම ද කන්නේ. දැන් ඔතන දෘෂ්ටියක් නේද තියෙන්නේ මම කනවා කියලා. එතකොට ඒක පිනවන්න දැනෙනව නම් පිනවන්නේ මම නේද?

දැන් සතර ඉරියව්වෙන්ම ප්‍රත්‍යවේක්ෂාවක් සිද්ධ වෙන්න ඕනේ. නමදායතන, නමණ්ඩයාතන, නවිභූෂ නට්ටායතන කියන එක නෙමේ.

එහෙනම් ගන්ධයටත් තියෙන්න එපැයි. නාසයට ඇයි රස දිවට විතරද? ඇයි නාසයට නැද්ද? ඇයි කනට නැද්ද? ඒක පිනවනවද? ඇයි එතකොට ඇසට නැද්ද ඕක. හැබෑ ප්‍රත්‍යවේක්ෂාව නම් මේ ආයතන 6ම එන අරමුණෝ ඇලෙන ගැටෙන එකෙන් මිදිලා අර අන්න උදයබ්බ ඤාණය කියන්නේ ඕකයි. ඒක දැක්කොත් විතරයි අපි කියන්නේ ප්‍රජානාති කියන එක තියෙන්නේ. නැත්නම් විජානාති, රැවටෙනවා.

එහෙනම් අපි සතර ඉරියව්වෙන්ම සිහිය පවත්වන එක තියෙනවා.

**මෙහෙණින් වහන්සෘ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෘ** අපි දැන් සුළඟක් වදින කොට ඒක සනීපයි කියලා කියනවා. දැන් සනීප මටද? නැත්නම් මේ කයට දැනෙන එකද? දැන් රසයි කියන්නේ දිවට දැනෙන එකද? මට දැනෙන රසක්ද? මම රසවින්දේ. දැන් මම කොහේද ඉන්නේ. ඇයි ඒක මට ගැට ගහන්නේ. කයට දැනෙන එක කයේ මිස කොහොමද මගේ වුණේ. මේක දෘෂ්ටියක් තියෙන්නේ. සක්කාය දෘෂ්ටි. ඒ කියන්නේ තියනවා කියලා හිතන එක දෘෂ්ටියක්. මම ඉන්නවා කියන දෘෂ්ටිය.

**ආර්යන් වහන්සෘ** ඒ අපි නොදැනුවත්වම අනුසෝතය තුළ දීර්ඝ කාලයක් ලෝකේ ඇත්ත කරගත්ත එකයි සක්කාය දෘෂ්ටි තියනවා ඉන්නවා කියපු එක. දැන් ඒක නැතිව ලෝකේ දකින්න පුරුදු වෙන එකයි ප්‍රත්‍යක්වේක්ෂාව කියන්නේ. මම නැතුව ලෝකේ දකිනවා. අන්න ක්‍රියා සිතයි, ප්‍රභාස්වර සිතයි. ක්‍රියාවලියයි ප්‍රභාස්වර සිතයි. පුංචි දරුවා මේ ලෝකේ ඉපදෙන කොට තිබුණු එකට එනවා. අර කෙලෙස් වලින් වැහිලා තියෙන්නේ හැමතැනම මම එකතු කරපු එකයි තියෙන්නේ. මම හැදුණු එකයි රැවටීම විඤ්ඤාණ මායාව. විඤ්ඤානං අනිදස්සනං කියන කොට මම නැති වෙනවා. අර අප්පටිජ්ජිතයි.

**මෙහෙණින් වහන්සෘ** ආර්යන් වහන්ස, බාහිර දේවල් ඇහෙනකොට ඉස්සර.

**ආර්යන් වහන්සෘ** ශබ්ද ඇහෙනවා, මෙතන පටලවා ගන්න එපා. දැන් පඩියක් නැග්ගට පස්සේ යට පඩියට වැටෙනවා. නැත්නම් දැන් උඩ පඩියට ආවට පස්සේ මොකද වෙන්නේ? සද්දේ ඇහෙනවා. **ශබ්දේ මම අහනවා නෙමේ. ශබ්දය ශබ්දයක් විතරයි. අන්න සුතේ සුත මත්තං.**

**මෙහෙණින් වහන්සඃ** ආර්යන් වහන්ස මම කියන්න හැදුවේ වාහනයක් යනකොට නිකම්ම ඔළුව හරවලා බලනවනේ. දැන් වාහනයක් ගියාට එහෙම බලන්න හිතෙන්නේ නෑ. ඒක ශබ්දය ශබ්දයක් විතරයි කියලා දැන් ඒකේ වටිනාකම අඩුයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** ඔව්. ඒක හරි. කියන දේ හරි. හැබැයි ඊටත් වැඩිය ගැඹුරු පැත්තක් අපිට පේන නිසයි අපි ඊට වැඩිය දෙයක් කියන්න උත්සාහ කරනවා. ඒ කියන්නේ ශබ්දය ඇහෙනවා. බැලුවත් ගැටලුවක් නෙමේ කියන එක මේකේ කියන්නේ.

**මෙහෙණින් වහන්සඃ** හරි. හරි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** මෙතන මමද කියලා තමන්ට මෙතන තියෙන සිහිය.

**මෙහෙණින් වහන්සඃ** හරි. හරි මට තේරුණා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** මේ සිහියයි වැදගත් වෙන්නේ. ඒ කිව්වේ මෙතන ඤායස්ස අධිගමාය, නිබ්බානං සච්චිකිරියාය. ඒ කියන්නේ සිහියක් ඔස්සේ වැඩෙන ඤාණයක් තියෙනවා. තමන් නැති බවට අන්න ඒ ඤාණය අවධි කර ගන්නයි මේ කියන්නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. එහෙමයි.

**ආර්යන් වහන්සඃ** ගැඹුරු දෙයක් වෙන වෙන ඒවා නිසා කිළුටු කරගන්න එපා.

**මෙහෙණින් වහන්සඃ** ආර්යන් වහන්සේ අර පිනවන ගතිය වන්නේ....

**ආර්යන් වහන්සඃ** ඔව්. ඒ හැමතැනම ඕක තියෙනවා. දැන් වාහනය කියන එකත් අවබෝධය තුළ තමන් වාහනය දකින එකත් නැති වෙනකොට වෙනම කතාවක් තියෙන්නේ. තමන් නැතුව වාහනය දකින්න පුළුවන් වෙන්න ඕන. අර ශබ්ද හැම එකම ඇහෙනවා ඇහෙන්නේ නැති වෙන්නේ නෑ. හැබැයි මම නැතුව අහන්න පුළුවන් වෙන්න ඕක. දැන් මම නැතුව දකින්නේ කොහොමද? දැන් පොත නැතිවෙලා නෙමෙයිනේ. අපි කිව්වේ ප්‍රසාද ස්පාක් නැතිවෙන්නේ නෑ කියලා. ස්පාක් වෙනවා කියලා. එහෙනම් පොත වෙනදා විදිහටම අන්ධ වෙලා නෑනේ. පේනවා.

**මෙහෙණින් වහන්සඃ** නෑ. නෑ. දකින කෙනෙක් නෑ නේ.

**ආර්යන් වහන්සෑ** නෑ. නෑ. මේකේ පොතෙන් තොර මමෙක් නෑ. දකින කෙනෙක් නෑ කියලා හිතුවොත් ඒකත් සිතුවිල්ලක් වෙනවා. ඒක එහෙම අපි හිතනවා. මුලින් ඒ අදියර පහුකරලා අපි කතා කරන්නේ. දැන් පස්සට ගියොත් මෙහෙණින් වහන්ස අපිට ඒක පස්සෙන් ගන්න වෙනවා.

**ආර්යන් වහන්සෑ** දැන් අපි කිව්වනේ පේනවා නෙමෙයි හිතනවා කියලා. සෝතාපන්න භූමියේදී අපි කරන්නේ පේනවා නෙමෙයි හිතනවා. දකිනවා නෙමෙයි හිතනවා. ඔක්කෝම එනවනේ. නාමය අන්තය රූපය අන්තෙන් මිදෙනවනේ. එතකොට බාහිර ලෝකයෙන් මිදෙනවනේ. සාමාන්‍යයෙන් අස්‍රුතවත් පෘථග්ජන කියන්නේ බාහිර ලෝකය ඇත්ත කරගෙන නේ.

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි.

**ආර්යන් වහන්සෑ** දැන් සෝතාපන්න කියන්නේ පටිසෝතය කියන්නේ බාහිර ඇත්ත කරගත්තේ නෑ කියන එකනේ. හැබැයි දැන් අනාගාමී භූමියේදී ඕක අනිත් පැත්ත ගහනවා. හිතන තැනත් දෙයක් නැති වෙනවා. එතකොට දැකපු, දේ දැකපු දේම පමණයි. ඔය දෙක පටලවා ගන්න එපා. තේරුණාද කියන එක. දැන් සෝතාපන්න භූමියේදී එළියේ නෙමෙයි. හිතනවා කියලනේ. අනාගාමී භූමියේදී කියන්නේ හිතන තැනත් දෙයක් නෑ ඇත්ත කතාව. එහෙනම් අරමුණ එනකොටම ඒකම තමයි තමන් දැන් නාමය වෙන් කරන්න බෑ. දෙපැත්තම නෑ. අන්ත දෙක නැතිවෙලා. නාමයමයි. තමන් ඒ කියන්නේ විඤ්ඤාණයටයි. ඒ කියන්නේ පොතටයි. ඒ කියන්නේ මනෝවිඤ්ඤාණය පොත. පොතමයි තමන්.

**මෙහෙණින් වහන්සෑ** එහෙමයි.

**ආර්යන් වහන්සෑ** දැන් එතකොට මොකද වෙන්නේ. තමන්වම මේ දකින්නේ. දැන් තමන්ට සිහියක් අවධි වෙනවා. ඒ කියන්නේ ඒ පොත කියන්නේ මේ මම. පොත තියනවා කියලා තමන්ට දැනෙන වටිනාකම ඒක ඕනියි කියලා දැනෙන හැඟීම ඔක්කෝම මම. ඒක තමයි දෘෂ්ටිය. ඒක තමයි සක්කාය දෘෂ්ටිය. ඒක තමයි ආත්මීය දැනීම. මේක දැන් සියුම් කෝණයක් තියනවා කියලා කිව්වේ. **බුදුන් වහන්සේ පෙන්නන්නේ, අර උපමාවක අශ්ව ලෝමක් සියක් කඩකට පැලෙයිද ඒකත් විය හැකියි. මහණෙනි හිමිදිරි උදෑසන තණඅග ඇති දිය බිඳක දේදුන්නක් දකියිද? ඊටම අදාළ වූ කෝණයකින් දකින්න කියන්නේ.** මේ ආත්ම

කෝණය හඳුනා ගන්නයි කියන්නේ. අපි මේ ඔක්කෝම බලන්නේ ආත්මීය කෝණෙන්. හැබැයි පොත නැතිවෙලා නැතුව පොත පරිහරණය කරන එක අර **ප්‍රභාස්වර හිතේ** පුංචි දරුවා බිත්තිය කියන සිතුවිල්ල ඇතිවුණ විට බිත්තිය කියන බවට ඇතිවන **සිහිය.** සිහියේ නෑ. **නාමරූප** බිත්තිය කියන සිත ඇතිවුණ බව, පොත කියන සිත ඇතිවුණ බවට සිහියක් තියෙනවා. ඔන්න ඔය සිහියට අවධි වෙන එක මෙහි **ප්‍රභාස්වරය.** ප්‍රභාස්වර සිතේ කෙනෙක් පුද්ගලයෙක් නෑ. අවබෝධක්ඥානය තුළ අවබෝධයක් උපදිනවා. කණ්ණාඩියේ කිසිවක් නැති බවට අවබෝධයක් තියෙනවානේ. ඒ ඥාණයක්නේ. අවබෝධක්ඥාණය.

**ආර්යන් වහන්සඃ** හැබැයි ඇත්ත ලෝකේ ඔක්කෝටම පේනවා කණ්ණාඩියේ මුකුත් නෑ වගේ. අවබෝධෙට පත්වෙන්න ඕනේ. හැබැයි ඒ දකින කෙනෙක් නෑ. මම දකිනවා නෙමෙයි දැකීම දැකීමක් විතරයි කියන කෝණේ. එහෙන්ම ඒක පිනවන කොට මම ඉන්නවා. ඒකට ගැටෙන කොට මම ඉන්නවා. ඒකට ඇලෙන කොට මම ඉන්නවා. හැබැයි එතන කෙනෙක් නැති බව දකිනව නම් ආත්ම කතාවක් නැති බව දකිනව නම් එතන ශබ්ද, වර්ණ කියලා දකිනවා නම්, ශබ්ද වර්ණ වල කොහෙන්ද දෙයක්? හැබැයි ශබ්ද වර්ණ පේන්නේ නැද්ද? ශබ්දයක් ඇහෙනවා වර්ණත් තියෙනවා. ඒ වගේ ආත්මයක් තියෙනවද? දැන් අපි චිත්‍රයක අඳිනවා පූසෙක්. අපි අඳිනවා නාගහක්. අඳිනවා පුටුවක චිත්‍රයක පුටු තියනවද?

**මෙහෙණින් වහන්සඃ** නෑ. ඒක චිත්‍රයක් විතරයිනේ.

**ආර්යන් වහන්සඃ** චිත්‍රයක පූසෝ ඉන්නවද? චිත්‍රයක නාගස් තියනවද? දැන් මේ චිත්‍රයක් තමයි ඔක්කෝම. අන්න අවබෝධය අති ගැඹුරුයි නේද? එක වචනෙන් කියන්න බෑනේ. ලුණු වගේ දැනෙන්න ඕන නේ මෙහෙණින් වහන්ස. චිත්‍රයක් දිහා බලාගෙන පුළුවන් ඇත්ත බැලීම ඕක කර ගන්න. ඒ වටිනාකමක් අපිට මේ නැති එකක් කියන්නේ. ඒක කියන්න බෑනේ. ලුණු වගේ දැනෙන එකනේ මේ කියන්නේ. අන්න අවධිය, අන්න හීනෙන් නැඟිටිනවා. අන්න අර සිහිය පුංචි දරුවා දැක්ක එක වටිනාකමක් නැතුව ලෝකේ දැක්ක පුංචි දරුවා **ප්‍රභාස්වරයි.**

**මෙහෙණින් වහන්සඃ** ඒකේ වටිනාකමක් නෑනේ. අපිනේ වටිනාකම දාගෙන තියෙන්නේ.

**ආර්යන් වහන්සඃ** මෙහෙණින් වහන්සේ නැවත කියනවා අහුවුණේ නෑ කියලා දැනෙනවා.

මොකද්ද මේ කොණේ වටිනාකම. ඡන්දරාගය දුරු වෙනවා කිව්වේ ඕකයි. චිත්‍රයේ පූසාගේ වටිනාකමක් එන්නේ නෑ. ඒකට හේතුව චිත්‍රයක් කියලා අපිට අවබෝදයි. ඇත්ත පූසෙක්ගේ වටිනාකම තිබුණේ කොහෙන්ද? ඇත්තම පුටුවක තියෙන වටිනාකම චිත්‍රයක පුටුවක් ඇන්දම කොහෙන්ද? එහෙනම් ඡන්දරාගය දුරුවෙනවා කියන්නෙ වෙනදා විදිහට ජේනවා. ඇහෙනවා වුණාට වටිනාකම නැතිවෙන්න ඕන.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ආර්ය වහන්ස තේරුණා.

**ආර්යන් වහන්සඃ අන්න එතනයි අවධිය. ඒ තමයි රහ නැතිවෙන තැන. අරහත්** අන්න රාග, ද්වේෂ, මෝහ ක්ෂය වී ගෙන යන තැන ඔතනමයි. ක්ෂය වේගෙන යන්න ඕන. තමන්ට තියෙන ඇල්ම මේක තේරුම් කරන්න අමාරු දෙයක් තමයි. අර ලුණු රහ වගේ කියනවා වගේ වැඩක් තමයි මෙතන තියෙන්නේ. **ඒක තමයි ආසවක්ඛාඤාණය** කියන්නේ තමන්ව හසුවෙනවා. අර ඇලෙන ස්වභාවය දියවීගෙන යනවා දැනෙන්න ඕන. බාහිරව කම්පනය වන ස්වභාවය දියවෙනවා. දියවෙන්නේ තමන්වයි. පොත තියනවා කියලා අපි ගත්තට දියවෙන්නේ තමන්වයි. පොතෙන් තොර මමෙක් නෑ. ඔය අවබෝධය නැතුව මේක දකින්නත් බෑ. මම වෙනයි. පොත වෙනයි කියලා හිතන කෙනෙකුට මේ ධර්මය හම්බ වෙන්නෙත් නෑ.

**මෙහෙණින් වහන්සඃ** දේශන කිහිපයක මේ දේ දේශනා කළා.

**ආර්යන් වහන්සඃ** ඔව්. '**ජානතෝ පස්සතෝ**' කියන එක පහුකරා. දැන් කියන්නේ ඊට වඩා ගැඹුරින් තමන් කොහේද කියලා අහන්නේ? දැන් දාලා තියෙන්නේ එහෙම නෙමේනේ. **"මට මම නැති වන හැටි"** නේ. දැන් ගැඹුරු තැනම පෙන්නන්න හදන්නේ. දැන් නිවන් දක්කන්න හදන්නේ. කරන්න බැරි දෙයක් කරන්න යන්නේ. එහෙම හරි කරන්න වෙනවා. නැත්නම් මේ කට්ටියට මේ මඟ හම්බ වෙන්නේ නෑ.

**මෙහෙණින් වහන්සඃ** අනේ ආර්යන් වහන්ස මට නම් හිතෙන්නේ මේ අපි නිවන් දකින්නට තමයි ඇවිල්ලා තියෙන්නේ. ඒක හරි පුදුමයි. සමහර දවස්වලට අහනවා ආර්යන් වහන්ස "භද්දේකරත්ත සූත්‍රය" අහනවා.

**ආර්යන් වහන්සඃ** ඒක හොඳයි මෙහෙණින් වහන්ස. ඒ එක එක්කෙනාට ඒ සූත්‍රවල තියෙනවා. ඇත්තටම එහෙම දෙයක් එක සූත්‍රයෙන් ඒ අයට ගොඩාක් දැනෙනනවා. ඒක ගැඹුරින් ගැඹුරට දැනෙන්න ගන්නව.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. ආර්යන් වහන්ස.

**මෙහෙණින් වහන්සඃ** ආර්යන් වහන්ස තව දේශනයක් තියනවා කායානුපස්සනාව 2 ඇහැව්වා. ඒක ගොඩාක් දැනෙනවා.

**ආර්යන් වහන්සඃ** ඔව්. ඒක ගොඩක් වටින දේශනයක්. ඒවා සැඟවුණු දේශන නේ. අපි දන්නවනේ ඔය දේශන අහපු නැති අයට දැන් වෙනස් කර කර ඉදිරිපත් කරන්නේ මේ පිරිසිදු නිවන් මග තියෙන්නේ. අපි කතා කරන හැම වචනයකම විතර්කයක් තියෙනවනේ. විතක්ක සංඥා කියන්නේ, ප්‍රපංච කරනවට, මන්ඤදනා කරනවා කියන්නේ. මේ හැමතැනම කෙනෙක් ඉන්න නිසයි ඒක සිද්ධ වෙන්නේ. ඔය කතා කරන්නේ හිතන්නේ හැම තිස්සේම කෙනෙක්. ඒකයි වචී සංඛාර වලට යමින් තියෙන්නේ. විතක්ක විචාර කිව්වේ. ඒ කියන්නෙ අභ්‍යන්තරයෙන් කෙනෙක් ඉන්න නිසානේ විතක්කය එන්නේ.

හැම ක්‍රියාවකම යටින් තියෙන්නේ, අර ධම්ම දින්නා කියනවනේ. හැම ක්‍රියාවටම යටින් තියෙන්නේ ආශ්වාස. ප්‍රශ්වාසය කියලා ඒක ඇත්තනේ. මේ ආශ්වාස ප්‍රාශ්වාස නිසානේ මේ හැම දෙයක්ම සිද්ධ වෙන්නේ. ඒ ඔක්කෝම විඤ්ඤාණයෙන්නේ වෙන්නේ. ආයතන ටික සම්පූර්ණයෙන් සිද්ධ වෙන්නේ ආශ්වාස ප්‍රාශ්වාස නිසා නේ.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි.

**ආර්යන් වහන්සඃ** එතකොට ඒ හැම සංඛාරයකටම යමින් තියෙන්නේ ආශ්වාස, ප්‍රාශ්වාස. දකින්න ටිකක් ගැඹුරුයි. ඒ කියන්නේ හැම ක්‍රියාවටම යටින් තියෙන්නේ ආශ්වාස ප්‍රාශ්වාස.

**මෙහෙණින් වහන්සඃ** ඒ කියන්නේ ආර්යන් වහන්ස ආශ්වාස, ප්‍රාශ්වාස නිසා තමයි මේ හැම එකක්ම පවතින්නේ.

**ආර්යන් වහන්සඃ** ඔව්. මේ senses ටික පවතින්නේ ඒ නිසයි. අර අපි කතා කරනව නේ මනෝ සංඛාර කියලා. අඬන කොට දුක මනෝ සංඛාර කියලා. හැබැයි ඒ දුක තියෙන්නේ වේදනා සංඛාර එක්ක. අර ධම්මදින්නා

විශාඛාවට කියනවනේ, මනෝ සංඛාරවලට යටින් තියෙන්නේ වේදනා සංඥා කියලා. යම් හැඩතලයක් එනකොට ඒකට දැනෙන ස්වභාවයනේ වේදනාව කියන්නේ. ඒ තමයි සංඥාව. අන්න ඒකටයි සංඛාර කියන්නේ. එකතු වෙන එකනේ. එතකොට මේ වචී සංඛාර, මනෝ සංඛාර, කාය සංඛාර සේරම දෙයක් තියන නිසානේ තියෙන්නේ. එතකොට බලන්න මේ සේරම වේදනා, සංඥා, සංඛාර ඔස්සේ නේද ස්කන්ධය හැදෙන්නේ. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නේ. ඒත් දෙයක්මනේ ගන්නේ. ඒ දේ නිසා නේ තියෙන්නේ. වචී සංඛාර, කාය සංඛාර, මනෝ සංඛාර. ඒත් ස්කන්ධයමයි. ඔක්කෝම මේ අරමුණේ එකම කතාව තියෙන්නේ. පැහැදිලි කරන්න එක එක්කෙනාට විවිධාකාර කියපුවා මේ.

**මෙහෙණින් වහන්සः** ආර්යන් වහන්ස එතකොට මේ බුදුන් වහන්සේ දේශනා කරලා තියෙන ඒ දීලා තියෙන උපමා මේ පංචස්කන්ධයට වැඩක් නැහැ වගේ නේ.

**ආර්යන් වහන්සः** නෑ. නෑ. පංචස්කන්ධය වෙනයි. පංචායතන වෙනයි. ඔක්කෝම මේ පටලවා ගන්න එපා තේරුණාද? පංචස්කන්ධය කියන එක ස්කන්ධ පහටත් කියනවා. පංචඋපාදානස්කන්ධය කියන එක ස්කන්ධයෙන් හදා ගත් දේ, අල්ල ගත්ත එක. උපාදාන කර ගත්ත එක. ඒක වෙනයි. පංචායතන කියන කොට ඒක වෙනයි. ඔය "ශ්‍රමණ සූත්‍රය" තුළ දැම්මේ. පංචායතන කියන එක අත්හැරලනේ පැහැදිලි කරන්නේ. පංචායතන කියන්නේ ස්කන්ධයේ අරමුණු වල සත්‍ය දකින එකයි ශ්‍රමණයෙක් වෙන්නේ. ආයතන 5ට එන අරමුණෙන් සත්‍ය දකින එක.

**ආර්යන් වහන්සः** ඒක පැහැදිලි කරන තේරුමේ ඒක ලියන්නේ නෑ. ඒකට හේතුව අවබෝධයක් නෑ **පංචායතනයට** එන අරමුණේ කියලා. ඒක නිසා උපාදානය කියලා නිකන් කියනවා. **ස්කන්ධය උදය වැය** දකිනවා කියන එක. **සිතට එන අරමුණේ සත්‍ය දකිනවා කියන එක.** ශ්‍රමණ කියන තැන මඟහැරිලා. ඒක තමයි එතනින් ලොකු අපරාධයක් සිද්ධ වෙලා. ධර්මයේ අවශ්‍යම තැන ගිලිහිලා. ශ්‍රමණයෙක් වෙන හැටි දන්නේ නෑ. හිතන්නේ ස්කන්ධය කියලා උදය වැය දකිනවා කියලා. ආයතන දකින්න ඕන. සිතට එන අරමුණේ සත්‍ය දකින්න ඕන. ඒ කියන්නේ ආයතන නේ. ආයතන වල ස්කන්ධය දකින්න ඕන. ඒකයි **පංචායතන උපාදානස්කන්ධ** කියලා තියෙන්නේ. **පංචායතන, පංචඋපාදානස්කන්ධය කියලා වෙනම**

**වචන 2ක් තියෙන්නේ. ඒක හරි ගැඹුරුයි. ඒ පැහැදිලි කිරීම පංචායතන පංචඋපාදානස්කන්ධය දැකීම අන්න සිතට එන අරමුණේ සත්‍ය දකිනවා කියන එක.**

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි.

**ආර්යන් වහන්සඃ** කොයිතරම් ගැඹුරුද? කෙනෙක් හම්බ වෙන්නේම නෑ. හැමතැනම තමන්ව අහිමි වෙලා යනවා. මෙතන හොඳින් කමටහන් විදිහට සුද්ද කරගෙන ගියොත් සෘද්ධිමය ස්වභාවයක් දැනෙන්න ගන්නවා.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** එතකොට තමන් කියලා කෙනෙක් හම්බ වෙන්නේ නැති දකින හැමදේකම තමන්ව අහිමි වෙලා යනවා. ඒක සෘද්ධිමය ස්වභාවයක්. ඒක වෙන්නේ මේ අවබෝධයෙන් හොඳට කමටහන සුද්ද කරගෙන ගියොත්. එහෙම සිද්ධ වෙනවා.

**ආර්යන් වහන්සඃ** තෙරුවන් සරණයි

**මෙහෙණින් වහන්සඃ** තෙරුවන් සරණයි

සියල්ලෝම සත්‍ය ධර්මය දකිත්වා !

තෙරුවන් සරණයි.